**ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන්**
**2022.12.15 දින පෙ.ව.09ඃ30 ට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ කිරිදිවැල සභා රැස්වීම් ශාලාවේදී**
**පැවති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාව.**

පැමිණීම ඃ-

| | | |
|---|---|---|
| 01. | පියසේන කාරියපපේරුම මහතා | ගරු සභාපති |
| 02. | අජිත් සිසිර කුමාර මහතා | ගරු උපසභාපති |
| 03. | ජේ.ඒ. සනිජයවර්ධන මහතා | ගරු මන්ත්‍රී |
| 04. | ගාමිණී නිහාල් විජේරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 05 | ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා | ගරු මන්ත්‍රී |
| 06. | වයි.ඒ.සරත් ගාමිණී මහතා | ගරු මන්ත්‍රී |
| 07. | බී.එස්.අයි. දයාසුන්දර මහතා | ගරු මන්ත්‍රී |
| 08. | චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 09. | රාජා ලක්ෂ්මන් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | නදීකා සඳරුවනි තෙන්නකෝන් මිය | ගරු මන්ත්‍රිනී |
| 11. | ජගත් සිරිලාල් අතුකෝරල මිය | ගරු මන්ත්‍රී |
| 12. | කේ.ඒ. කරුණාජීව මහතා | ගරු මන්ත්‍රී |
| 13. | දනුෂ්ක සාලින්ද දේශප්‍රිය මහතා | ගරු මන්ත්‍රී |
| 14. | එස්.එම්.රත්නසිරිලාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | උපාලි නිශාන්ත අනුරජිත් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | ඩබ්ලිව්. සුදර්මි මිය | ගරු මන්ත්‍රිනී |
| 17. | සුමිත් චිත්‍රානන්ද ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ලෙස්ලි ගුණරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 19. | දුමාල් මධුසංක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | ජානක පුෂ්ප කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 21. | ලලිත් වසන්ත පීරිස් මහතා | ගරු මන්ත්‍රී |
| 22. | අජන්තා රෝහිනී මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | ඩබ්.පී.ගංගා කුමාරි ජයවර්ධන මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්.එල්. ඥානවතී මිය | ගරු මන්ත්‍රිනී |

.

එක්සත් ජාතික පක්ෂයඃ-

| | | |
|---|---|---|
| 01. | උභය කුමාර ජයවර්ධන මහතා | ගරු විපක්ෂනායක |
| 02. | පුෂ්පකුමාර රත්නායක මහතා | ගරු මන්ත්‍රී |
| 03. | මලින්ද ගුණරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 04. | එස්.ඒ.ඩී.වික්‍රමරත්න මිය | ගරු මන්ත්‍රිනී |
| 05. | ඩබ්.දමිත් ප්‍රියශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 06. | නීල්ද ඩග්ලස් සමරකෝන් මහතා | ගරු මන්ත්‍රී |
| 07. | ප්‍රසාදිනී රේණුකා කාරියවසම් මිය | ගරු මන්ත්‍රිනී |
| 08. | සමීර මාගම්මන මහතා | ගරු මන්ත්‍රී |
| 09. | බී.ඒ. නදීකා ප්‍රියංගනී මිය | ගරු මන්ත්‍රිනී |
| 10. | රුවනි දමයන්ති තිසේරා මිය | ගරු මන්ත්‍රී |
| 11 | එල්.ඒ.මධුර සංජීව අතුකෝරල මහතා | ගරු මන්ත්‍රී |

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඃ-

| | | |
|---|---|---|
| 01. | අමින්ද රෝහිත මහතා | ගරු මන්ත්‍රී |
| 02. | බී.එල්. රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා | ගරු මන්ත්‍රී |

ජනතා විමුක්ති පෙරමුණඃ-

| | | |
|---|---|---|
| 01. | දිමුතු ප්‍රදීප් පල්ලෙවෙල මහතා | ගරු මන්ත්‍රී |
| 02. | ධම්මිකා මානෙල් රාමනායක මිය | ගරු මන්ත්‍රිනී |
| 03. | සමන්ත රංජන් දඹරගේ මහතා | ගරු මන්ත්‍රී |

ප්‍රජාතන්ත්‍රවාදී ජාතික පෙරමුණ ඃ-

| | | |
|---|---|---|
| 01. | චන්ද්‍ර කුමාර සෝමසිංහ මහතා | ගරු මන්ත්‍රී |

**2022.12.15 දින පැවති මාසික සභා රැස්වීම**

<u>සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් ඃ-</u>

| | | |
|---|---|---|
| 01. | තාරක අබේවික්‍රම මහතා | ගරු මන්ත්‍රී |
| 02. | පද්මිණි සමරසේකර මිය | ගරු මන්ත්‍රීනී |

**(අ) පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

1. **2022.11.10 දින පැවති මාසික සභා සභා රැස්වීම් වාර්තාව**

<u>ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, 2022.11.10 දින දොම්පෙ ප්‍රාදේශීය සභාවේ පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සභාව පිළිගැනීම සුදුසු බව මම යෝජනා කරනවා.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන**

- නැත -

**(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා**

1. ගරු මන්ත්‍රී තාරක අබේවික්‍රම මහතා
2. ගරු මන්ත්‍රීනී පද්මිණී සමරසේකර මිය

**(ඈ) සංදේශ, පෙත්සම් ,පැමිණිලි ඉදිරිපත් කිරීම.**

- නැත -

**(ඉ) යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

- නැත -

**(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඊ) 1. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

ප්‍රාදේශීය සභාවේ අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා රට ආනුෂාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද, ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල , කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහාද , ප්‍රාදේශීය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගතයුතු බවත් එසේ පත්කර ගනු ලබන මුදල් පිළිබඳ කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට වියයුතු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය

මහා සභාව විසින් තෝරාපත් කර ගනු ලබන සභිකවරු 15 දෙනෙකුගෙන් සමන්විත වියයුතුයි. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කමිටුවේ සභාපතිවරයා වියයුතුය.
අවම කාන්තා නියෝජනය මුළු සාමාජික සංඛාවෙන් 25% ක් වියයුතුයි.

එම කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින් පත්කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

2022.12.15 දින පැවති මාසික සභා රැස්වීම

**<u>මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව ඃ-</u>**

| | |
|---|---|
| 1. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා | කාරක සභා සභාපති |
| 2. ගරු මන්ත්‍රී සනී ජයවර්ධන මහතා | කාරක සභා සාමාජික |
| 3. ගරු මන්ත්‍රී ඉන්දික දයාසුන්දර මහතා | කාරක සභා සාමාජික |
| 4. ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා | කාරක සභා සාමාජික |
| 5. ගරු මන්ත්‍රී ජානක පුෂ්ප කුමාර මහතා | කාරක සභා සාමාජික |
| 6. ගරු මන්ත්‍රී එස්.එම්. රත්නසිරිලාල් මහතා | කාරක සභා සාමාජික |
| 7. ගරු මන්ත්‍රී විතානගේ සුදර්මී මිය | කාරක සභා සාමාජික |
| 8. ගරු මන්ත්‍රීනි ඒ.ඒ.ඩී අජන්තා රෝහිණී මිය | කාරක සභා සාමාජික |
| 9. ගරු මන්ත්‍රී ලෙස්ලි ගුණරත්න මහතා | කාරක සභා සාමාජික |
| 10. ගරු මන්ත්‍රී උභය කුමාර ජයවර්ධන මහතා | කාරක සභා සාමාජික |
| 11. ගරු මන්ත්‍රී ඩග්ලස් සමරකෝන් මහතා | කාරක සභා සාමාජික |
| 12. ගරු මන්ත්‍රීනි ප්‍රසාදිනි කාරියවසම් මිය | කාරක සභා සාමාජික |
| 13. ගරු මන්ත්‍රී දඹරගේ සමන්ත රන්ජන් මහතා | කාරක සභා සාමාජික |
| 14. ගරු මන්ත්‍රී අමින්ද රෝහිත රාජපක්ෂ මහතා | කාරක සභා සාමාජික |
| 15. ගරු මන්ත්‍රී චන්ද්‍ර කුමාර සෝමසිංහ මහතා | කාරක සභා සාමාජික |

එම යෝජනාව ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) 2.ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

ප්‍රාදේශීය සභා පනත හා වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සභාව වෙත පැවරී ඇති බලතල අතරින් පහත උපලේඛනයේ විස්තර කරන බලතල එහි සඳහන් නිශ්චිත කොන්දේසි වලට හා නියමයන්ට යටත්ව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ සඳහන් විධි විධාන අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත පවරා දියයුතු යයිද, යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය

1. සැපයුම් වැඩ හා සේවාවලට අදාලව රු.මිලියන 02 සිට මිලියන 05 දක්වා ගෙවීම් අනුමත කිරීම

එම යෝජනාව ගරු මන්ත්‍රී විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) 3.ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පොදු මංමාවත් ඇතුලු යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහාද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල ,කාර්ය, හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහාද ප්‍රාදේශීය සභාව සඳහා කාර්මික සේවා පිළිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගතයුතු බවත් එසේ පත්කරනු ලබන කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ සඳහන් ආකාරයට වියයුතු බවටත් යෝජනා කරමි

ඉහත කී උපලේඛනය

සභාව විසින් තෝරාපත් කර ගනු ලබන සභිකවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත වියයුතුය.
අවම කාන්තා සාමාජික සංඛ්‍යාව මුළු සාමාජික සංඛාවෙන් 25% ක් වියයුතුය.

කමිටුවේ විෂය පථය පිළිබඳ දැනුමක් ඇති සිවිල් පුද්ගලයන්ගෙන් සමන්විත වියයුතුය.

එම කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින් පත්කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

**තාක්ෂණ සේවා කමිටුව ඃ-**

| | |
|---|---|
| 1. ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා | කාරක සභා සභාපති |
| 2. ගරු මන්ත්‍රී තාරක අබේවික්‍රම මහතා | කාරක සභා සාමාජික |
| 3. ගරු මන්ත්‍රී කේ.ඒ. කරුණාජීව මහතා | කාරක සභා සාමාජික |
| 4. ගරු මන්ත්‍රිනී ගංගා කුමාරි ජයවර්ධන මිය | කාරක සභා සාමාජික |
| 5. ගරු මන්ත්‍රී මලින්ද ගුණරත්න මහතා | කාරක සභා සාමාජික |
| 6. ගරු මන්ත්‍රිනී රුවනි තිසේරා දමයන්ති මිය | කාරක සභා සාමාජික |
| 7. ගරු මන්ත්‍රී බී.එල්.ආර්.ඒ. බුත්පිටිය මහතා | කාරක සභා සාමාජික |

එම යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) 5.ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රජා සංවර්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහාද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහාද ප්‍රාදේශීය සභාව සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගතයුතු බවත් එසේ පත් කර ගනු ලබන නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට වියයුතු බවත් යෝජනා කරමි.

සභාව විසින් තෝරාපත් කර ගනු ලබන සභිකවරුන් 07 දෙනෙකුගෙන් සහ බල ප්‍රදේශයේ පදිංචි කරුවන් 10 දෙනෙකුගෙන් සමන්විත වියයුතුයි.

අවම කාන්තා සාමාජික සංඛ්‍යාව මුළු සාමාජික සංඛාවෙන් 25% ක් වියයුතුය.

කමිටුවේ විෂය පථය පිළිබඳ දැනුමක් ඇති සිවිල් පුද්ගලයන්ගෙන් සමන්විත වියයුතුය.

එම කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින් පත්කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

| | |
|---|---|
| 1. ගරු මන්ත්‍රී වයි.ඒ. සරත් ගාමිණී මහතා | කාරක සභා සභාපති |
| 2. ගරු මන්ත්‍රී ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා | කාරක සභා සාමාජික |
| 3. ගරු මන්ත්‍රී නිශාන්ත වෙඩිසිංහ මහතා | කාරක සභා සාමාජික |
| 4. ගරු මන්ත්‍රී මලින්ද ගුණරත්න මහතා | කාරක සභා සාමාජික |
| 5. ගරු මන්ත්‍රිනී පද්මිණී සමරසේකර මිය | කාරක සභා සාමාජික |
| 6. ගරු මන්ත්‍රී මධුර සංජීව අතුකෝරල මහතා | කාරක සභා සාමාජික |
| 7. ගරු මන්ත්‍රී දිමුතු ප්‍රදීප් පල්ලෙවෙල මහතා | කාරක සභා සාමාජික |
| 8. ගරු මන්ත්‍රී ලලිත් වසන්ත පීරිස් මහතා | කාරක සභා සාමාජික |
| 9. ගරු මන්ත්‍රිනී ඩබ්.එල්.ඥානවතී මිය | කාරක සභා සාමාජික |

එම යෝජනාව ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) 6.ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය, හා සනීපාරක්ෂාවට අදාල කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහාද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහාද, ප්‍රාදේශීය සභාව සඳහා පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගතයුතු බවත් එසේ පත්කර ගනු ලබන පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට වියයුතු බවත් යෝජනා කරමි.

ඉහත කී උප ලේඛනයේ

සභාව විසින් තෝරාපත් කර ගනු ලබන සභිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත වියයුතුය.

අවම කාන්තා සාමාජික සංඛ්‍යාව මුළු සාමාජික සංඛාවෙන් 25% ක් වියයුතුය.

කමිටුවේ විෂය පථය පිළිබඳ දැනුමක් ඇති සිවිල් පුද්ගලයන්ගෙන් සමන්විත වියයුතුය.

එම කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින් පත්කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

**<u>පරිසර හා පහසුකම් කමිටුව ඃ-</u>**

| | |
|---|---|
| 1. ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා | කාරක සභා සභාපති |
| 2. ගරු මන්ත්‍රී දුමාල් මදුසංක මහතා | කාරක සභා සාමාජික |
| 3. ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා | කාරක සභා සාමාජික |
| 4. ගරු මන්ත්‍රිනී ඩබ්ලිව්. සුදර්මි මිය | කාරක සභා සාමාජික |
| 5. ගරු මන්ත්‍රී චිත්‍රානන්ද ජයවීර මහතා | කාරක සභා සාමාජික |
| 6. ගර මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා | කාරක සභා සාමාජික |
| 7. ගරු මන්ත්‍රිනී එස්.ඒ. ඩී. වික්‍රමරත්න මිය | කාරක සභා සාමාජික |
| 8. ගරු මන්ත්‍රිනී නදීකා බාලසූරිය මිය | කාරක සභා සාමාජික |

එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.සනී ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) 7. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

අංක 2155/8 හා 2016.12.24 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර සීතා කුමාරි අරඹේපොල මහත්මිය විසින් පනවන ලද ප්‍රාදේශීය සභා මුල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නීති මගින් නියම කර ඇති පරිදි දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දේපල බදුදීම හෝ කුලියට දීම සඳහා ටෙන්ඩර් කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු බවට මම මෙම සභාවට යෝජනා කරමි.

1. ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ,ලේකම්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නම්කරන ලද නිලධාරියෙකු හා ගරු සභාවේ සභිකවරුන් දෙදෙනෙකු

එසේ පත්කිරීමේදී කාන්තා නියෝජනයද සැලකිල්ලට ගතයුතුය.

01. ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා
02. ගරු මන්ත්‍රිනී පද්මිණී සමරසේකාර මිය

එම යෝජනාව ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

(ඊ) 8. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

අංක 2155/8 හා 2016.12.24 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර සීතා කුමාරි අරඹේපොල මහත්මිය විසින් පනවන ලද ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නීති මගින් නියම කර ඇති පරිදි දොම්පෙ ප්‍රාදේශීය සභාවේ සැපයුම්, වැඩ, සේවා හා විකිණීම් වලට අදාලව ස්ථිර ටෙන්ඩර් කමිටුවේ සංයුතිය (එසේ පත්කිරීමේදී කාන්තා නියෝජනයද සැලකිල්ලට ගතයුතුය.)

පහත සඳහන් පරිදි විය යුතු බවට මම මෙම සභාවට යෝජනා කරමි.

01. ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ,ලේකම්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නම්කරන ලද නිලධාරියෙකු හා ගරු සභාවේ සභිකවරුන් හතර දෙනෙකු

1. ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා
2. ගරු මන්ත්‍රිනි ඩබ්.සුදර්මි මිය
3. ගරු මන්ත්‍රී රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා
4. ගරු මන්ත්‍රී ඩී.සමන්ත රංජන් මහතා

එම යෝජනාව ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

(ඊ) 9. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 184 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද රීති අනුව , 2023 වර්ෂයේ පහත සඳහන් පරිදි මාසික මහා සභා රැස්වීම් පැවැත්වීම සුදුසු බවට මම යෝජනා කරමි.

| | | | |
|---|---|---|---|
| 2023 | ජනවාරි | - 10 | (අඟහරුවාදා ) |
| 2022 | පෙබරවාරි | - 09 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | මාර්තු | - 09 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | අප්‍රියෙල් | - 11 | (අඟහරුවාදා ) |
| 2023 | මැයි | - 11 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | ජූනි | - 08 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | ජූලි | - 13 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | අගෝස්තු | - 10 | (බ්‍රහස්පතින්දා |
| 2023 | සැප්තැම්බර් | - 07 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | ඔක්තෝම්බර් | -12 | (බ්‍රහස්පතින්දා ) |
| 2023 | නොවැම්බර් | - 09 | (බ්‍රහස්පතින්දා |
| 2023 | දෙසැම්බර් | - 14 | (බ්‍රහස්පතින්දා ) |

එම යෝජනාව ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 10. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2023 වර්ෂය අදාල අංශ මගින් සකස් කරන ලද වාර්ෂික සැලසුම් (විගණන හා කාර්ය සාධක නිර්ණායක උපදෙස් පරිදි සකස් කරන ලද ) අනුමත කිරීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2023
2. සංයුක්ත (සිව්වාර්ෂික ) සැලැස්ම - 2023 - 2026
3. තිරසාර සංවර්ධන සැලැස්ම - 2023
4. පුහුණු සැලැස්ම - 2023
5. ප්‍රසම්පාදන සැලැස්ම - 2023
6. අභ්‍යන්තර විගණන සැලැස්ම - 2023
7. කසල අපහරණ සැලැස්ම - වාර්ෂික - 2023
8. සංවර්ධන හා නඩත්තු සැලැස්ම - 2023

8. ආදායම් පුරෝකතන වාර්තා - 2023
9. වියදම් පුරෝකතන වාර්තා - 2022

එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ජ්.සී ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය

**ඊ) 11. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

2023 වර්ෂය සඳහා සභාව සතු දේපළ ටෙන්ඩර් මගින් බදුදීමට අදාළව පහත සඳහන් ටෙන්ඩර් කමිටු වාර්තා සභාව පිළිගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. 2022.11.16 දින පැවති ටෙන්ඩර් මණ්ඩල වාර්තාව
2. 2022.11.30 දින පැවති ටෙන්ඩර් මණ්ඩල වාර්තාව
3. 2022.12.13 දින පැවති ටෙන්ඩර් මණ්ඩල වාර්තාව

එම යෝජනාව ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 12. ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා යෝජනා කරයි ඃ-**

2023 වර්ෂයට ටෙන්ඩර් නොගිය දේපල තක්සේරු වටිනාකමින් 20% ක මුදලක් අඩුකර නැවත ටෙන්ඩර් කැඳවීමටත් 2023 වසර නව තක්සේරුව මත ලංසු මුදල වැඩිවීම් හේතුවෙන් 20% කින් අඩුකරන ලද අවම ලංසු මුදලටද ටෙන්ඩර් ලබා ගැනීමට ඉදිරිපත් නොවන්නේ නම් ඔවුන්ට එම ටෙන්ඩරය ලබාගත හැකි උපරිම ලංසු මුදල සඳහන්කරන ලද ලිඛිත ඉල්ලීම් 2022.12.27 දිනට පෙර ඉදිරිපත් කිරීමටත් එම ඉල්ලීම් පිළිබඳ ටෙන්ඩර් කමිටුව විසින් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී දමික් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් වැඩිකිරීම තුල සභාවට ආදායමක් ලබාගන්න අවස්ථාවක් ලැබෙනවා. පරණ අය ඒ වකවානුව තගු කිරිදිවැල පොළ ගැන තිවුවොත් දුලිප් කියන කෙනා හැමදාම පොළ ගන්නවා. පසුගිය කාලයේ අපට අයවියයුතු මුදල් ටික මේ වෙනකොට අයකරගෙන තිබෙනවාද, ඒ සම්බන්ධව ගන්න ක්‍රියා මාර්ගය කුමක්ද,

කිරිදිවැල පොළේ සියළුම මුදල් ගෙවා තිබෙනවා. රථ ගාලේ මුදල් කොටස් වශයෙන් ගෙවීම් කරනවා.

**ඊ) 13. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

2021 ණයගිම් ව්‍යාපෘතිවලට අදාල මුදල් (මෙම වසරේ ක්‍රියාත්මක නොකරන)

| ව්‍යාපෘතියේ නම | මුදල (රු.) |
|---|---|
| 1. මේරිලන්ඩ් ප්‍රජාශාලාවේ ඉතිරිවැඩ නිම කිරීම | 345000.00 |
| 2. ඉස්කෝලවත්ත නාන ළිඳ ළඟ කාණු පද්ධතිය | 100000.00 |
| 3. කැන්දගොල්ල නාන ළිඳ අළුත්වැඩියාව | 250000.00 |

| | |
|---|---|
| 4.දොම්පෙ උප කාර්යාලයේ පියස්ස සැකසීම | 293358.12 |
| 5. පුගොඩ ආයුර්වේදය සහිත නව ගොඩනැගිල්ලේ 11 අදියර | 5000000.00 |
| 6. උමංදල නාවැටිය පාර කොන්ක්‍රීට් කිරීම | 200000.00 |
| | 6188358.10 |

2021 වර්ෂයේ ණයහිමි කරන ලද ඉහත සඳහන් ව්‍යාපෘති රටේ පැවති මිලගණන් ඉහලයාම හේතු කොටගෙන කිසිසේත්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි අතර එම ඇස්තමේන්තු මෙම වර්ෂයේ නව මිලගණන් යටතේ සංශෝධනය කළද වෙන්කරන ලද මුදලට අදාල කාර්යයන් සාර්ථකව ඉටුකිරීමට හැකියාවක් නොමැති බැවින් එම ව්‍යාපෘති අවලංගුකර එම මුදල මෙම වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට යෙදවීමටත් මිලගණන් ඉහලයාමේ හේතුව මත සාර්ථකව අවසන් කිරීමට ප්‍රමාණවත් නොවන, උපලේඛනයේ සඳහන් ව්‍යාපෘති සඳහා සකස්කරන ලද අමතර ඇස්තමේන්තු පිළිගෙන ඉහත මුදල් ඒ සඳහා යොදවාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 14. ගරු මන්ත්‍රී නිශාන්ත අනුරජිත් වෙඩිසිංහ මහතා යෝජනා කරයි ඃ-**

2022 මන්ත්‍රී යෝජනා ඃ-

<u>මුල් යෝජනාව</u> ඃ-

- ❖ නෙස්කැෆේ මැෂිමක් සහ සෙවිලි තහඩු සඳහා - 300000.00

<u>සංශෝධිත යෝජනාව ඃ-</u>

- ❖ නෙස්කැෆේ මැෂින් එක සහ ප්‍රජා මණ්ඩල උපකරණ සඳහා - 300000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එම්.රත්නසිරිලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 15. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශීය සභාව මගින් පැවැත්වීමට යෝජිත පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තු පිළිගැනීමටත් සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| කාරණය | <u>ඇස්තමේන්තු මුදල</u> |
|---|---|
| 1. සෞඛ්‍ය,මාර්ග කම්කරු මහතුන් සඳහා සිදුකරනු ලබන වෛද්‍ය සායනය (2022.12.21) | රු. 91000.00 |
| 2. දො.ප්‍රා.ස. ලියාපදිංචි ප්‍රජාමණ්ඩල වල සාමාජිකයින් වෙත ස්වයංරැකියා පුහුණු අවස්ථා සම්පාදනය කිරීම සඳහා ප්‍රජා මණ්ඩල නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන (2022.12.23) | රු. 27000.00 |

එම යෝජනාව ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 16. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2017,2018,2019 හා 2020,2021 ණයගැති උපලේඛනවල සඳහන් ව්‍යාපෘති සඳහා ගෙවීම් වාර්තාව අනුව ව්‍යාපෘති වලට අදාල මුදල් ඉල්ලුම් කළද එම ප්‍රමානයෙන් මුදල් නොලැබී ඇත. වැඩිපුර වෙන්කර ඇති ණයගැතියන් කපාහැරීම් සිදුකර ලේඛන නිවරිදි කර ගැනීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.සනි ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 17. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2017,2018,2019 හා 2020,2021 වර්ෂවල ණයහිමි ලේඛනවල නොගෙවා රඳවාගෙන පවතින ණය හිමි ශේෂ ආදායමට ගෙන ලේඛන නිරවුල් කිරීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි .

එම යෝජනාව ගරු මන්ත්‍රී චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 18. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2019 විගණන ජේදවලටද අදාලව පවතින විවිධ ණයහිමි ලේඛනයේ වසර ගණනාවක සිට ඉදිරියට පැමිණෙන ශේෂ කිහිපයක් පවතින බැවින් 2019,2020,2021 වර්ෂවලට අදාලව රු.2728854.07 ක විවිධ ණයහිමි අධි වෙන්කිරීම ආදායමට ලබා ගැනීමටත් තැන්පත් ලේඛනයේ 2019 වර්ෂයට අදාල තැන්පතු රු.1856014.25 ක මුදල ආදායමට ලබා ගැනීමත් නැවත මෙම මුදල් ගෙවීමට සිදුවුවහොත් සමුච්චිත අරමුදලින් නැවත ගෙවීමට යටත්ව ආදායමට ගැනීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 19. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

දොම්පෙ ප්‍රාදේශීය සභාව සතු දොම්පෙ පොදු වෙළඳපල සඳහා නව තක්සේරුව, රජයේ තක්සේරු දෙපාර්තමේනතුව මගින් අංක GM/RP/285, හා 2022.10.10 දිනැති ලිපියෙන් දන්වා ඇත.

ඒ අනුව නව තක්සේරුව පිළිගැනීමටත් එම තක්සේරුව 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 20. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

දොම්පෙ ප්‍රාදේශීය සභාව මගින් කියාත්මක කිරීමට යෝජිත පහත සඳහන් වඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. සෞඛ්‍ය හා මාර්ග කම්කරු මහතුන් සඳහා සිදුකරනු ලබන වෛද්‍ය සායනය (2022.12.21) රු. 91000.00

2. දො.ප්‍රා.ස. ලියාපදිංචි ප්‍රජාමණ්ඩල ලෙ සාමාජිකයින් වෙත ස්වයංරැකියා පුහුණු අවස්ථා රු. 27000.00
සම්පාදනය කිරීම සඳහා ප්‍රජාමණ්ඩල නිලධාරීන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන (2022.12.23)

එම යෝජනාව ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 21. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2021 ණයගිම් ව්‍යාපෘති සඳහා 2022.06.30 දක්වා කාලය ලබාදීමට 2022.02.17 දින මහා සභාව විසින් තීරණය කරන ලදී. නමුත් ජාතික අයවැය චක්‍රලේක අංක 03/2022 මගින් ව්‍යාපෘති ක්‍රියාත්මත කිරීම අත්හිටවූ අතර එය ලිහිල් කරනු ලැබුවේ 2022.10.06 LGD/11/24 මගිනි. එම නිසා ගිවිසුම් කාලය ඉක්මවා තිබුනත් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමාද දඩ අය කිරීමට කාල සීමාවක් කිසිදු ව්‍යාපෘතියකට නොමැති බැවින් එම නිසා මෙම වසරේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ප්‍රමාද දඩ අයකිරීමකින් තොරව ගෙවීම් කිරීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 22. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2022.02.17 දින මහා සභාවේ න්‍යායපත්‍ර අංක (ඊ) 05. යටතේ සභා සම්මත වි ඇති පරිදි මහසභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි. (ඒ අනුව 2022.12.15 දින දක්වා මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් ඇමුණුම් අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත.)

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 23. ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා යෝජනා කරයි ඃ-

2022 මන්ත්‍රී යෝජනා ඃ-

මුල් යෝජනාව ඃ-

- ❖ රදාවාන කනත්ත පාරේ පස් පිරවීම - 77000.00

සංශෝධිත යෝජනාව ඃ-

- ❖ රදාවාන උතුර පැහැසර ප්‍රජාමණ්ඩලය වෙත රෝද පුටු දෙකක් ප්‍රදානය කිරීම - 77000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එම්.රත්නසිරිලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 24. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

2022 මන්ත්‍රී යෝජනා ඃ-

මුල් යෝජනාව ඃ-

- ❖ මීතිරිගල සේද ගොවිපල පාර - 700000.00

සංශෝධිත යෝජනාව ඃ-

- ❖ මීතිරිගල සිරකඳවුර පාර - 700000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

1. 2022.11.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු රැස්වීම් වාර්තාව

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ 2022.11.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සභාව පිළිගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි, දැන් මේ සභාවේ මන්ත්‍රීවරු සියළුදෙනාටම ප්‍රශ්නයක් තිබෙනවා මේ මැතිවරණය. ඉස්සරහට තිබෙනවා කියනවා නෑ කියනවා කට්ටියක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙනවා. කොට්ඨාශ 25 ,13 කට කඩා තිබෙනවා. මෙහි දැනට තිබෙන වාතාවරණය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)

ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරු ගණන 50% කින් කපාහරින්න යෝජනාවක් ඇවිත් තිබෙනවා. ඒ අනුව මැතිවරණ ක්‍රමය වෙනස්නොකර කරනවානම් කොට්ඨාශ අඩු කරන්න. ඒ අනුව අපේ ගත්තොත් 25,13 කට අඩුකර තිබෙනවා සීමානිර්ණ කොමිෂන් සභාවේ යෝජනාවක් දැනට.දේශපාලන කිසිකෙනෙක් සම්බන්ධකර නොගෙන ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන් විසින් භෞතිකව කොට්ඨාශ 13 ට කඩලා තිබෙනවා. මෙය ගැටළු සහගතයි. දැන් කොට්ඨාශ 25 ම ජයග්‍රහණය කරපු අපිට 12 දෙනෙක් අයින් කරන්න වෙනවා. විපක්ෂයටත් මේ ප්‍රශ්නය තිබෙනවා. මෙයට දේශපාලන එකගතාවයක් අද වෙනකම් ලැබිලා නැහැ. මේ මත අළුත් ක්‍රමයට මැතිරණයක් කෙරෙන්නේ නැහැ කියායි මගේ අදහස.නමුත් ජන්දයක් තිබුණත් 25 ට තමයි තියන්නේ. ජන්ද ලැයිස්තු ප්‍රතිශෝධනය නොකර මෙය කරන්න බැහැ.මෑතක මැතිවරණයක් තිබෙනවානම් අලුත් ක්‍රමය ක්‍රියාත්මක වන්නේ නැහැ.

ගරු විපක්ෂනායක උභයකුමාර ජයවර්ධන මහතා (එ.ඩා.ප.)

ගරු සභාපතිතුමනි, මැතිවරණය කොහොමත් තියන්නේ දැන් තිබෙන ක්‍රමයට. 09 වෙනිදා විසුරවනවා කියන එකයි කතාව. අළුත් කොට්ඨාශ 13 කට කඩපු එකට එක කොට්ඨාශයකට එක පක්ෂයකින් 03 දෙනෙකුට ඉල්ලන්න පුලුවන්.ඒ 3 දෙනාගෙන් වැඩිම ජනප්‍රිය කෙනා පත්වෙනවා.ජාතික ලැයිස්තුවෙන් 8 හෝ 9 ක් පත්වෙයි. ජනාධිපතිතුමාට ඕනෑ මෙය භාගයකට අඩු කරන්න. එවිට එය වෙනවා. නමුත් ජන්දය තියන්නේ දැනට තිබෙන ක්‍රමයටයි.

**(උ) වෙනත් වාර්තා**

1. මාසික ආදායම් වාර්තාව - 2022 ඔක්තෝම්බර්
2. මාසික ආදායම් වියදම් වාර්තාව - 2022 ඔක්තෝම්බර්

ඉහත සඳහන් මාසික ආදායම් වාර්තාව හා මාසික වියදම් වාර්තා සභාව පිළිගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී වන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

3. මාර්ග නඩත්තු ඒකකයේ දෛනික නඩත්තු කටයුතු -2022 නොවැම්බර්
4. දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ඩෙංගු ඒකකයේ දෛනික කටයුතු පිළිබඳ වාර්තාව -2022 නොවැම්බර්

අංක 3 සහ 4 යටතේ ඉදිරිපත් කර ඇති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මාර්ග නඩත්තු ඒකකයේ හා ඩෙංගු ඒකකයේ දෛනික නඩත්තු කටයුතු පිළිබඳ සකස් කරන ලද වාර්තා මෙදින සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

(ඌ) වෙනත් කරුණු

ගරු මන්ත්‍රීනී නදීකා ප්‍රියංගනී මිය (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි,2022.11.29 දින දොම්පෙ ප්‍රාදේශීය සභාවේ අයවැය යන අතරතුර දොම්පෙ සතිපොළේ අනවසර ඉදිකිරීමක් සිදුව තිබෙනවා. මෙය සිදුකර තිබෙන්නේ ඔබතුමාවත් කාර්යභාර නිලධාරීවත් නොදැනුවත්වයි. දො.ප්‍රා.ස. සතු භූමියක ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම ස්ථානයක ඉදිකිරීම් කරන්න පුලුවන් කියන එක දොම්පෙ ප්‍රදේශයේ ජනතාවගේ මතය වී තිබෙනවා.ලක්ෂ 1500 ක් වැනි මහජන මුදලක් වියදම්කර සභාවට හදලා දීපු දෙයින් සභාවට ගතහැකි ප්‍රයෝජන සැහෙන්න තිබෙනවා. අපේ දොම්පෙ 405 ග්‍රාම සේවා වසමේ රජ්‍ය නිලධාරීන්ට ඉන්න තැනක් නැහැ. පෞද්ගලික තැන්වල ඉන්නවා. දොම්පෙ පොළේ ඉහල මාලයේ අපිට පාට්ෂන්කර හරිදෙන්න පුලුවන් නේද, සභාවට එයින් මුදලක් අයකර ගතහැකියි. මහජනයාගේ මුදල් අවභාවිතවන එක දකිනකොට අපිට මන්ත්‍රීවරු විදිහට ලොකු කණගාටුවක් ඇතිවෙනවා.

ඔබතුමා ගැන අහනවිට අපි සභාපතිතුමා හොඳයි පක්ෂ භේදයෙන් තොරව හැමෝටම සේවය කරන බව අපි හැමවෙලාවෙම කියනවා. මේ වනවිට ඔබතුමාටත් දොම්පෙ නගරයට යන්න බැරි තත්වයක් උදාවී තිබෙනවා. මෑතකදී අපේ සුසානභූමියේ ගස් ටික කපලා ගෙනාවේ පෙරපාසලේ වහලය හදන්නයි. ඒක දකින ප්‍රදේශවාසීන් හිතන්නේ නිලධාරීන්ට ඕන විදිහට කියක් හරි ගසාකන්න තමයි මේ ටික කපන් ගියේ කියලයි. මේ පවතින අක්‍රමවත් ක්‍රියා නිසා සභාවට ලොකු කැලලක් සිදුව තිබෙනවා.
ඒවගේම අපි අළුත් සතිපොළ ඉදිකර පරණ පොළෙන් අළුත් පොළට ගෙනාවට පසු පරණ පොළේ ඉදිකිරීම් කඩා අවසන්කර අන්තිමට එහි යකඩ බට ටික වුනත් සභාව විකුණගෙන කෑව බවයි අද දොම්පෙ පැතිරයන්නේ. ඔබතුමාවත් දන්නෙ නැතිව ඇති මේවන දේවල්. දොම්පෙ උප කාර්යාලයේ නිලධාරීන් අවංකව සේවයක් කරනවා නමුත් එතනට ඇගිලි ගහන පිරිස වැඩියි. ඔබතුමාටත් ඉහලින් ඉන්න පිරිසක් දොම්පෙ නගරයේ ඉන්නවා. උපකාර්යාලය හරහා කෙරෙන ක්‍රියාවන්වලදී ඍබතුමාගේ කාරුණිකව අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.
දොම්පෙ පොළේ ඒවගේ අනවසර ඉදිකිරීමක්කර තිබෙන්නේ මොකටද, දැන් සති දෙකක් පොළේ මාළු දැම්මේ නැහැ. කතාව යනනේ මාළු දාන්න ආරක්ෂිතව හදන බවයි.මිනිසුන්ට මාළු බලලා ගන්න ඕනෑ. දැල් ගහලා කොටුකරලා දෙන්න හැදුවේ කාටද,මෙය සභාවට හදලා ආදායම් මාර්ගයක් එන විදිහට දෙන්න තිබුණා.
**225** කිරිදිවැල කොළඹ ප්‍රධාන මාර්ගයට තාර කම්පැනියෙන් වතුර වැටිලා ප්‍රධාන පාර සම්පූර්ණයෙන් කැඩී ගොස් තිබුණා. ඒක PRDA එකෙන් හැදුවා. ඒ හැදුවත් කම්පැනියෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගන්නේ නැහැ. ආයතන දෙකක් තිබෙනවා. නැවතත් පාර ඒ විදිහටම කැඩී ගොස් තිබෙනවා.
දොම්පෙ ආසනයේ අපේ ගිවිසුම්ගතවූ පාරවල් තුන්සිය ගානක් අපිට හිටපු සභාපතිතුමා කරන්න දුන්නේ නැහැ. මේ වනවිට දොම්පෙ අතුරු පාරවල් සියල්ල කැඩිබිඳී ගිහින් ඉවරයි. හැම මනුස්සයෙක්ම ලියුමක් ලියාගෙන ඇවිත් සභාපතිතුමාට කියා පාරට ප්‍රිමික්ස් ටිකක් දාලා දෙන්න දෙපැත්ත කපා සකස් කරදෙන්න කියා ඉල්ලීම් කරනවා. අපි ඒ පාරවල් ටික කලානම් ඒ දොම්පෙ මිනිසුන්ටයි. ඒ අයිතිය භුක්ති විඳින්නේ අපේ ජනතාවයි. ඒ හැමදයෙක්ම අපේ හිටපු සභාපතිතුමා නැති කළා. ඔබතුමා එහෙම නැහැ. හැමදෙයක්ම සොයා බලා කළා. විශාල වශයෙන් කැඩී බිඳී ගිය පාරවල් ගැන අවධානය යොමුකළා. **2023** ලබන්නාවූ නව වර්ෂය සියළුදෙනාටම සිතුම් පැතුම් ඉටුවන වාසනාවන්ත වර්ෂයක් වේවා කියා පතමින් මම නිහඬවෙනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතුමියනි, දොම්පෙ සතිපොළේ මාළුකඩය ක්ෂණිකව හදලා තිබෙනවා. මම සොයා බැලුවිට කිවුවේ ඩීපීසර් ආදිය තබාගන්න විදිහක් නැති නිසා ආරක්ෂාව තහවුරු කරන්න ඒ ප්‍රමාණයෙන්ම දැලක් ගසා දොරක් දැමූ බවයි. එනිසා මම ඉන් එහාට ගියේ නැහැ.

<u>ගරු මන්ත්‍රීනී නදීකා ප්‍රියංගනී මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, අද වෙනකම් ඒ මාළු විකුණු කෙනා ඒ මාළු කඩයට ගියේ නැහැ. එයා ඒක ප්‍රතික්ෂේප කරනවා. දැන් ගහහෙන කුකුල් කූඩුවක් වගේ මාළු වෙළඳාම් කිරීමට නොහැකි බව කියනවා. මාළුවලට මොනවටද ආරක්ෂාව. මාළු වෙළඳාම්කරන අය මේ සති දෙකේම මාළු වෙළඳාම් කළේ පාරෙයි.

<u>ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා(එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි,දැන් මෙය හැදුවා ඔබතුමත් ,කාර්‍යාලයවත් දන්නේ නැතිව. මෙය හැදුවේ අපේ හිටපු උපසභාපතිතුමා බව කියනවා.එතුමා හදලා ගානක් තියාගෙන වෙන කෙනෙකුට දෙන්න හැදූ බවයි ඒ පැත්තේ කතාව තිබෙන්නේ. එය ඇත්තද නැත්තද දන්නේ නැහැ. නමුත් අපේ මන්ත්‍රීතුමිය කියන්නා වගේ මෙහි යටි අරමුණක් තිබෙනවා. මෙය කාටද දෙන්න යන්නේ. ඒක හැදුවානම් එතුමිය කිවුවා වගේ ටෙන්ඩර්කරලා සභාවට ආදායමක් ගන්න.

ගරු මන්ත්‍රීනි නදීකා ප්‍රියංගනී මිය (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි,ඔබතුමාට කතාකර කිවු පසු අනවසර ඉදිකිරීම් එහෙම කරන්න බැහැ. කඩා ඉවත් කරන්න කියා ඔබතුමා කියලා තිබෙනවා. ඊට පසු පොලිසියට කතාකරලා කිවු පසු හෙට උදේට කඩමු අපිත් එන්නම් කිවුවා. පහුවදා කිසිම කැඩිල්ලක් නැහැ. මාලු ලෙස්ලිගේ කැමැත්තටයි මෙය හැදුවේ කඩන්න ඕන නැහැ, එයාගේ ආරක්ෂාවටයි හැදුවේ මෙය කියලා.මාලු ලෙස්ලි මොකුත් දන්නේ නැහැ. ඒ මනුස්සයාට කිසිම ආරක්ෂාවක් ඕනත් නැහැ.

ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, රදාවාන හංදිය ලස්සනට හැදුවා. නමුත් දාලා තිබෙන ලයිට් ටික පත්තුවෙන්නේ නැහැ. එනිසා නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත්කර ඒ ලයිට් ටික පත්තුවෙන්න මොනවා හෝ වැඩ පිලිවෙලක් කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී නීල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි, වර්ෂ අවසාන සභාවේ අදහස් කීපයක් සභාවට ප්‍රකාශ කරන්න අවශ්‍යයි. ගිය සභා වාරයේ මම සභාවේ හිටියේ නැහැ. අපේ කොට්ඨාශයේ හිතවත් ගරු මන්ත්‍රීතුමා වැරදි ප්‍රකාශයක්කර තිබෙනවා. එය වාර්තාවේ නැති වුනත් නිවැරදි වියයුතුයි. මම කීපවරක්ම මේ සභාවේ මයිලැන්ඩ් ඉඩම සම්බන්ධව කතා කළා. ඒ ඉඩමට තවම අනුමැතිය ලැබී නැහැ. නමුත් ඒ අය විකුණගෙන යනවා. එහිදී ජනතාවගේ ප්‍රශ්න සම්බන්ධව මුලින්ම සභාව දැනුවත් කළෙත් පොලිසියට ගිහින් මුලින්ම පැමිණිලි කළෙත් මම. ඒ ප්‍රශ්නය එක්කම ඒ අසලම මගේ ඉඩමක් තිබූ නිසා මටත් ගැටළුවක් තිබූ නිසා ඒ ජනතාවත් එක්ක මම කතා කළේ. ඊටපසුව මගේ ඉඩම බේරගන්න බැරිව මම ඒ අයටම ඉඩම විකුණුවා. ඒ ඉඩම හරහා තමයි මේ අය වතුර ටික බස්සන්න මුලින්ම සූදානම්ව සිටියේ අනවසරයෙන්. ඒ ගැන මම සභාව දැනුවත් කළා. පසුව දැන් මේ අය මෙය මිලදීගෙන ඒ අයට ක්‍රමානුකූලව කාණු පද්ධතිය හදලා ඒ වතුර ටික කුඹුර හරහා බස්සන්න පුලුවන්කම තිබෙනවා. දැන් ඒ අය සභාවේ නිර්නායකයන් අනුව හදන්නේ නැති ප්‍රශ්නය තිබෙනවා. එනිසා දෙපස ජනතාව පීඩාවට පත්ව තිබෙනවා. පසුගිය වැහි කාලයේ මේ අක්කර 9 වතුර ටික ඒ කාණුව හරහා ගිහින් දෙපස ඉඩම්වලට ගැටළු ඇතිවෙලා තිබෙනවා. මෙය මගේ ඉඩම විකිණීම තුල වුන ප්‍රශ්නයක් නොවෙයි. කාණුව බඳින්න සුදුසුම තැන තමයි ඒ ඉඩම.එනිසා මමත් ඔවුන්ට ඒ ඉඩම විකුනා මගේ ප්‍රශ්නය විසඳාගත්තා වගේම සභාවේ උපදෙස් අනුව ඒ කාණු පද්ධතිය බැඳලා ජනතාවගේ පීඩාවත් විසඳෙන විදිහටයි කටයුතු කළේ. මම ඩීල් එකක් දැමූ බව මන්ත්‍රීතුමා කියා තිබුනා. මම ජනතාවට ප්‍රශ්නවන ඩීල් දාලා නැහැ. දාන්නෙත් නැහැ. සභාවේ වගකීම තමයි ජනතාවට පීඩාවක් නොවන විදිහට ඒ ආයතනය මෙහෙයවීම.

පසුගිය මාස 12 තුල අපි දැක්කා මේ සභාවේ වැඩ කටයුතු කරන පිළිවෙල. අපි එක්ක වැඩකරපු සභාපතිවරු එක්ක සසඳන විට නායකයෙක් හැටියට ඇහුම්කන්දෙන එක ඉතා හොඳින් කළ නායකයෙක් හැටියට අපි දැක්කා. අපි යමක් කිවු විට යම් ප්‍රමාණයකට හෝ ඉෂ්ඨ කරන්න මහන්සියක් ගත් සභාපතිවරයෙක් වශයෙන් මගේ පෞද්ගලික ස්තුතිය පුදකරනවා.

පසුගිය අවුරුද්ද පුරාම සභාවට කළහැකි සහ නොහැකි දේවල් විශාල ප්‍රමාණයක් තිබුණා. එහිදී විදිපහන් කොට්ඨාශයේ මන්ත්‍රීතුමත් මහන්සිවෙන්න ඇති. ක්‍රමානුකූලව විදිපහන් හැදුනා වුනත් නොහැදුනු තැන් තිබෙනවා. හුගක් ජනතාව පැමිණිල කරන්න එන්නේ නැහැ. පැමිණිලි කරන විදිපහන් පමණක් හැදෙනවා.අපි පැමිණිල්ලක් වාචිකව කරපු විට හරි උප කාර්යාලය හරහා වැඩ පිලිවෙලක් හදන්න කියන යෝජනාව කරනවා.

අපේ අතුරු මාර්ග ගත්විට ප්‍රිමික්ස් යොදා යම් ප්‍රමාණයකට හදලා දුන්නා. වතුරුගම ඇටඹගහවත්ත යාකරන ලුතින්න අමරසිංහ මාවත මේ වනවිට නඩත්තු වියයුතු මට්ටමක තිබෙනවා. මම අපේ කොට්ඨාශ මන්ත්‍රීතුමාටත් කිවුවා. එය පිළිසකර කර දෙන ලෙස ඉල්ලීම කරනවා.

මේ අවුරුද්ද අපි සියළුදෙනා ඉතා බැඳීමෙන් කටයුතු කළා. ලබන අවුරුද්දෙත් තමන් බලාපොරොත්තුවන ප්‍රාර්ථනා ඉටුවන සුභ වර්ෂයක් වේවා කියා පතමින් මම නිහඬවෙනවා.

<u>ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, මුලින්ම විශේෂ ස්තුතියක් කළයුතුයි. මාගේ මවගේ අවමංගල්‍යට පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු සහභාගි වුනා. ඒවාගෙම් සභාපතතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත් කාර්ය මණ්ඩලය ඒ මොහොතේ පටන් අවසානය දක්වාම දක්වූ සහයෝගයට මම ස්තුතිවන්තවෙනවා. නම් නොකිවත් සහභාගි වූ සියලු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්තවෙනවා. මගේ අසල්වැසි මන්ත්‍රීතුමා තමයි මට හාමුදරුවෝ වඩම්මලා දුන්නෙත් ඒකටත් මම ස්තුතිවන්තවෙනවා.

මයිලැන්ඩ් ඉඩම ගැන  දිගින් දිටගම කතා කළා. ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්තවෙනවා. ඒත් මැතකාලයේ ඔබතුමා නිහඩ වුනා. ඔබතුමාගේ ඉඩම හරහා බඳින බැම්ම කොහොම බැම්මක්ද කියලා බලන්න. මම සභාවට මේ ගැන කිවුවම සභාව මේ ගැන දන්නෙත් නැලු. සභාවෙන් අනුමැතියක් දී නැතිලු. නමුත් ඔවුන් සිතුසේ ඉඩම් කැලි විකුණගෙන යනවා. සභාවේ තාක්ෂණ නිලධාරින් මේ බැම්ම බඳිනකොට ගිහින් බලනවානම් හොඳයි

මගේ අම්මා අසනීප වෙලා රදාවාන රෝහලට අරන් ගියා. අම්මාව වතුපිරිවල රෝහලට ගෙනයන්න ඇම්බියුලන්ස් එකේ ඩීසල් නැහැ කියා දොස්තර මහතා කිවුවා. එතුමාගේ රු.5000 ක බෙහෙත් රෝහලට දුන්නාලු. ඇත්තද බොරුද දන්නේ නැහැ. අපිට පුලුවන්නම් මන්ත්‍රීතුමා එක්ක කතාකරලා ඒවගේ පොඩි දෙයක් හරි කරලා දෙන්න ඒක ලොකු දෙයක්. අපිට පුලුවන් මට්ටමක් තිබෙනවා. අපිට තිබෙන්නේ පොඩි රෝහල් 3 ක් වගේ. ඒ ටිකටවත් අඩු ගානේ බෙහෙත් ටිකක්වත් ලබාදෙන්න කටයුතු කරන්න පුලුවන්නම් හොඳයි.

කිරිඳිවැල බස්නැවතුම්පල ඉතා ජරාජීර්ණ වෙලා තිබෙනවා. අඩුගානේ ඒ ටිකට ලයිට් ටිකවත් දාලා දෙන්න. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා එක්ක කරේ අතදාගෙන දමිත් මන්ත්‍රීතුමා කතාකර කර ඉන්නවා අපි ඊයේ දැක්කා. කමක් නැහැ. අපි සියළුදෙනා  එකතුවෙලා දොම්පෙ හදමු.

<u>ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, පසුගිය දවස්වල කිරිඳිවැල පිට්ටනියේ පැවැත්වුණු හෝලි උත්සවය සම්බන්ධයෙන් ඔබතුමාටත් මේ සභාවටත් චෝදනා එනවා. ඩයි කුඩු ගහගෙන මත්වෙලා අඩ නිරුවතින් නටලා තිබෙනවා පාසල් ළමුන්. මත්වෙලා පොළේ බක්කි වල වැටිලා ඉඳලා තිබෙනවා. මේවගේ දෙයක් මේ නගරෙට එනකම් අපි දන්නේ නැහැ. ඒක හරිම කැත විදිහට තමයි සංවිධානය කර තිබුනේ. පොලිසිය හරි කැඳවලා ඒක නවත්වන්න තිබුණා. දවලුත් තිබිලා රෑත් තිබෙනකම් බලා සිටියාද, මහදුරක නෙමෙයින් මේ ළඟනේ තිබුණේ. සභාපතිතුමා විදුහල්පති ගුරුවරු මේකට කොච්චර බනිනවද, මේකට අනුමැතියක් දුන්නනේ.

<u>ගරු සභාපතිතුමා(ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතමනි, මේක DJ එකක් කිවුවම අපි අවසර දුන්නා.  සංගීත සංදර්ශනයක් විදිහට මේක ඉල්ලුවේ. ගහනකොට තමයි ආරංචි වුනේ මෙහෙම එකක් කියලා. ආයේ එකක් ඒ විදිහට ඉල්ලුවා. අපි දුන්නේ නැහැ. ඉදිරියට දෙන්නෙත් නැහැ. DJ කිව්වහම මාත් හිතුවේ සංගීත සංදර්ශනයක් කියලයි. වෙච්චදේ ඊට දැන් කරන්න දෙයක් නැහැ.

<u>ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, ඒවගේම කිරිඳිවැල නගරයේ මදුරු ගහනය ඉතාම වැඩියි. අපේ ලේකම්මහත්තයටත් ඩෙංගු හැදිලා. මෙහේ ඩෙංගු තිබෙනවා කියා ඔබතුමා පිළිගන්නවනේ. සභාවේ ඉන්න ඉහලම නිලධාරිටත් ඩෙංගු හදිලා. සෙන්ට්‍රල් ෆිනෑන්ස් එක ගාව ටයර් කඩේ පිටුපස පස් අරන් දාලා එතන වතුර පිරිලා මදුරුවෝ ඉන්නවලු. මට කතා කළා සභාවට මේ ගැන දැනුවත් කළාද අහන්න. කිරිඳිවැල දැන් ඩෙංගු විමානයක් වෙනවා.

කිරිඳිවැල මහා විද්‍යාලය, කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලය, සංඝමිත්තා විද්‍යාලය මේපාසල් තුනේම පාසල් බස් රථ ගහන්නේ මිලාන් ජයතිලක ක්‍රීඩාංගනයෙයි. බස් ප්‍රමාණය වැඩි නිසා දැන් පාරේ ගහනවා.

පාරේ වාහන දමුවහම වංගුවෙන් එන වාහන පේන්නේ නැහැ. ඊයේ පෙරේදා ගමේ අයයි බස් අයිතිකාරයොයි අතර වචන හුවමරුවක් වෙලා තිබෙනවා. පස් කන්දක් ගොඩ ගහලා තිබෙන නිසයි වාහන ටික ඇතුල් කරගන්න බැරිව තිබෙන්නේ කියලා දැනගත්තා. ඒ ගැන ඔබතුමා බලන්න. මේ කොට්ඨාශයේ A9 -25 ක් තිබෙනවා. A9 -25 න් 20 ක්ම ගත්තේ සංඝමිත්තා පාසලෙන්. කිරිදිවැල මහා විද්‍යාලයේ සා.පෙළ සමත් ප්‍රතිශතය සියයට හතලිස් ගණන් වගේ තිබුනේ. A9 එකක්වත් නැහැ. මේ පාර 67.5% ක ගානක් සම්වෙලා තිබෙනවා. ඔබතුමාගේ පාසල වන්නේ මධ්‍ය මහා විද්‍යාලය. ඒ විද්‍යාලයෙන් අධ්‍යාපන කටයුතු වැඩිකර ගන්න අපි කටයුතු කරනවා. ළගදිත් සංඝමිත්තා විද්‍යාලය වොලිබෝල්වලින් 2 තැනට ආවා. A9ගත් අය ඉදිරියේදී බලාපොරොත්තු වන්නේ ගණිත , විද්‍යා කරන්න. අද ඒ අයට යන්න පාසලක් නැහැ. ගණිතය විද්‍යාව වාණිජ ඇතුලු විෂයන් කරන්න හොඳ පාසලක් මේ කොට්ඨාශයේ නැති එක ගැන වගකීම අපි දේශපාලකයෝ විදිහට ගතයුතුයි. ඒවගේම මොනවා කිවුවත් මේ කොට්ඨාශ 25 ඇතුලත මේ මැතිවරණය අනිවාරයෙන්ම තියනවා. පළාත් සභාත් තියයි. පොහොට්ටුවේ වර්තමාන තත්වය ගැන බලන්න ජනාධිපතිතුමාට ඕනකමක් තිබෙනවා. ඒ නිසා මේ ජන්දය පැවැත්වෙනවා කියන එක විශ්වාස කරන්න පුලුවන්.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.සනී ජයවර්ධන මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, රැස්වීම අවසාන වන මොහොතේ කරුණු කීපයක් පිළිබඳව අවධානය යොමු කරන්නට බලාපොරොත්තුවෙනවා. එයින් එක කරුනක් වනුනේ 2021 මුදල් වෙන්කළ ව්‍යාපෘති කීපයක් තිබෙනවා මේ වෙනකම් ක්‍රියාත්මක නොවුනු. මම ඒවා ලේකම් මහතාට දැනුම්දී තිබෙනවා. පසුගිය අවුරුදු කීපය තුල අපේ ප්‍රදේශයේ විශාල වැඩ කොටසක් කළා. ඒවායේ සමහර ඒවා අවසන්කර නැහැ. සමහර කාපට් පාරවල් තිබෙනවා භාගෙට හදලා තැනින් තැන ඉතුරු කරලා.

මේ අඩුපාඩු ටික සකස් කරන්න ඒ සමාගම් සමග කතාකර කටයුතු කරන්න. එගොඩ පැලහැල පාරේ බෝක්කුව ඉතිරිකර හැදුවා. දෙමළගම පාරේ වෙල කොටස  ඉතිරිකරලා. රඹුටන්වත්ත පාරේ කොටසක් ඉතිරිකර හැදුවා. මේ පිළිබඳව ඒ අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන සමාගම් සමග කතාකර මේවා ක්‍රියාත්මක කරන්න වැඩ පිලිවෙලක් සකස් කරන්න. නැතිනම් ඒ කරපු දේවල්වල ප්‍රතිඵල ලබාගන්න බැහැ ඒ පාරවල් කැඩිලා යනවා.

වානලුවාව ක්‍රීඩාංගනය එදා තිබුනේ කොහොමද කියා ඔබතුමාට මතක ඇති. ගල් මතුවු ගොඩලි සහිත ඉඩමක්. අපි ඔබතුමාලා එකතුවෙලා පිට්ටනියක් වශයෙන් හදලා මේ වෙනකොට ඒ ප්‍රදේශයේ තිබෙන ප්‍රධානකම ක්‍රීඩාංගනයක් බවට පත්කර තිබෙනවා.  පසුගිය වකවානුව තුල ඔබතුමත් හිටපු සභාපතිතුමත් මේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කරන්න විශාල වැඩ කොටසක් කළා. ඔබතුමා විශේෂයෙන් ඒ ක්‍රීඩාපිටියේ වැට හදන්න විශාල මහන්සියක් ගත්තා. මේ වෙනකොට  ඒ වැටේ භාගයක් විතර හදලා තිබෙනවා. ලබන වර්ෂයේ ඒ වැටේ ඉතිරි කොටස හදන්න මුදල් වෙන්කරගන්න පුලුවන් වෙයි කියා මම සිතුවා. නමුත් මේ වෙනකාට වෙලා නැහැ. මේ ක්‍රීඩාපිටිය සඳහා ඉඩම දුන්නේ වෝල්ටර් පෙරේරා මහතා කිසිදු මුදලක් අරගෙන නොවෙයි. එතුමාට ගෞරවයක් වශයෙන් මේ ක්‍රීඩාපිටිය අංග සම්පූර්ණව හැදියයුතුයි.ඉදිරියේදී ලැබෙන මුදල් වලින් ක්‍රීඩාපිටියේ ඒ ඉතිරි කොටස හදන්න යම්කිසි මුදලක් වෙන්කරදෙන ලෙස ඉල්ලා සිටිනවා.

තව මාසයක් විතර යනවිට විසුරවලා ජන්දය තියන්න කුමක් හෝ ක්‍රියා මාර්ගයක් ගන්නවා. ඒනිසා මේ කෙටි වකවානුව තුල මේ වැඩ කොටස කරදෙන්න කියන ඉල්ලීම කරනවා.

අපි අවුරුදු 30,40 ක් ප්‍රාදේශීය සභාව තුල එකට වැඩකරපු අය.  අපි දේශපාලන වශයෙන් දෙපැත්තකට බෙදී සිටියත් සෑම අවස්ථාවකම මිත්‍රශීලීව කටයුතු කළා. ඒ කාලය තුල ප්‍රාදේශීය සභාව තුලත් අනිකුත් කටයුතුවලදිත් සුහදව කටයුතු කරන්නට සහයෝගය දුන් සියළුදෙනාට මගේ ස්තූතිය පිරිනමනු ලබනවා. අවසාන වශයෙන් ලබන්නාවු නව වසර සුයළුදෙනාටම සුභ නව වසරක් වේවායි පතමින්  සියළුදෙනාටම ගෞරවනීය ස්තූතිය පුදකරමින් මා නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී  මධුර සංජීව අතුකෝරල මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, අද දොම්පෙ  සතිපොළ ගැන දීර්ඝ වශයෙන් කතා වුනා. දොම්පෙ සතිපොළ  හැදීමේ කටයුතුවලදී විපක්ෂනායකතුමා ඇතුළු අපි මන්ත්‍රී කණ්ඩායමත් එක්ක මහනගර සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීත් එක්ක දො.ප්‍රා.ස. තමයි ඉස්සෙල්ලාම සාකච්ජාව තිබුණේ හර්ෂණ රාජකරුණා මැතිතුමත් හිටියා. එහිදී කිරිදිවැල නගරය ගැන විතරයි සැලසුම් සකස්කරගෙන ගියේ. දොම්පෙ ගැන සැලකිල්ලක් නැතිව කටයුතු කරන්නේ ඇයි කියා මම එහිදී නැගිටලා ඇසුවා.

ඊට පස්සේ අපිට කිවුවා දොම්පෙ වෙළඳ සංගමය සමග කතාකර එහි ඉන්න නිලධාරීන් සහ ප්‍රාදේශීය සභාව කැඳවාගෙන නගරය සැලසුම් කරන්න කිවුවා සංවර්ධනය කරන විදිහ ගැන. එහිදී වෙළඳ සංගමයේ ඉල්ලීම වුනේ නගරයට කාණු පද්ධතියක් නැහැ වතුර බහින්න හදලා දෙන ලෙසයි. මූලිකව ඒ කටයුතුවලට මුදල් අනුමත කරගෙන කාණු පද්ධතියේ වැඩ කරගෙන යනවිට දොම්පෙ පොළේ වැඩ කටයුත්ත ගැන කතා කළා. ඒකට අපිට මුදල් ලබාදුන්නා. අපි ඒ වැඩ කොන්ත්‍රාත්කරුවන්ට දුන්නේ නැහැ. අපි සියළු වැඩ සැලසුම් අමාත්‍යාංශයට දීලා ඒ හරහා වැඩ කරවුයේ. එහි මූලික සැලසුම් දුන්නෙ අධියර කීපයකටයි. නමුත් අපිට ඒ වැඩ කටයුතු සියල්ල අවසන් කරගන්න බැරි වුනා. එහි විවෘත කිරීමේ කටයුතුවලට මම සහභාගි වුනා. ඒවා කළේ වෙන කවුරුවත් ,අන්තිමට ලකුණු වැටුනේ වෙන කාටවත්. නමුත් අපි ඒවාට සැලුනෙත් නැහැ. කිසිම ප්‍රතිලාභයක් බලාපොරොත්තු වුනෙත් නැහැ . එක කඩ කැල්ලක්වත් ඉල්ලුවෙත් නැහැ. අද ඒ කටයුතු කරන්න පුලුවන් වුනා. ඒ ආණ්ඩුව එදා තවදුරටත් තිබුණානම් ඔතන තව ප්‍රයෝජන ගන්න පුලුවන් විදිහට අපි වැඩසැලසුම්කර තිබුණා.

එය කරගන්න බැරිවුන එක ගැන කණගාටුවෙනවා. ඔය පොළේ උඩ කොටස පුද්ගලික පංතියකට දෙන්න පුලුවන් නම් වටිනවා. සභාවට ආදායමක් වන විදිහට ඒ ගැන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අපේ ප්‍රදේශයේ දුෂ්කර පාසල් තිබෙනවා කණිෂ්ට විද්‍යාල ගොඩක්. ඒවායේ ගොඩක් ඉන්නේ ආර්ථික අපහසුතා තිබෙන දරුවන්. පිට්ටනිය සුද්ධ කරගන්න බැහැ විදුහල්පති කෙනෙකුට ඒ සඳහා මැෂින් එකකට තෙල් ගහන්න සල්ලි නැහැ දෙමාපියන්ට. ගුරුවල කණිෂ්ඨ විද්‍යාල පිට්ටනියේ විශාල කැලයක් තිබෙනවා. සෙල්ලම් කරන්නවත් තැනක් නැහැ. ඒ විද්‍යාල ටිකේ විස්තර අරගෙන කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

අද රනිල් වික්‍රමසිංහ නායකතුමා වර්නනා කරනවා නමුත් සමගි ජනබල වේගයේ බල මණ්ඩලේ ඉන්නවා. මොකක්ද මේ දේශපාලනය මේ මන්ත්‍රීවරුන්ගේ මේ දේශපාලනය හිතාගන්න බැහැ.අපි නම් එක පැත්තක නම් ඒ පැත්තම තමයි. තමනගේ නායකයා වර්නනා කරගන්න ඕනැ. දේශපාලනය කියන්නේ මෙය නොවෙයි. එය තේරුවී අරගෙන වැඩ කරන්න කියා ඉල්ලා සිටිනවා. කොයි පැත්තේ සිටියත් තමන් ප්‍රතිපත්තියක් තියාගතයුතුයි. ප්‍රාදේශීය සභා මැතිවරනයකින් මේ රටේ තිබෙන ප්‍රශ්නවලට මොකුක් බලපෑමක් එල්ල කරන්න බැහැ. ලේකම්වරුන්ට බලය දෙයි. විසුරවයි ප්‍රාදේශීය සභාව.නමුත් ජන්දයක් තියනවා කියා අපිත් එක්ක නම් සාකච්ජා කර නැහැ අපිත් ඉන්නේ නායකතුමා එක්කයි. ඒ ගැන බයක් ඇතිකරගන්න එපා. අපි ඉදිරියට එන විදිහට මුහුන දෙමු කියා ඉල්ලා සිටිමින් මම නිහඬවෙනවා.

<u>ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, පුගොඩ ගඟ පාරේ තිබෙන කැරගල මාවත සැහෙන දුරට කොන්ක්‍රීට් කළා. අලුතින් පාලම හදනකොට පාලම දෙපැත්ත ඉස්සුවා. එතකොට පාර වලට ගියා. එතකොට වහිනකොට අතන ගඟ. මෙතන ඇල. මේකට මුදල් වාගයක් පාස් වෙලා තිබුනා. ඒකට කඹ ඇදිල්ලක් තිබුණා. ඒකට අවධානය යොමුකරලා ඒ පාර සකස්කරදෙන්න සභාපතිතුමනි.

**1994** සිටන් දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු **22** ක් තමයි සිටියේ. **2018** මැතිවරණයෙන් පලමු පාරට මන්ත්‍රීවරු **43** ක් ආවා. අපේ මන්ත්‍රීවරු එක තැනකට ගෙනත් සමුහ ඡායාරූපයක් ගන්න තිබෙනවානම් ඒක හොඳ සැමරුමක් වෙයි. **91** ප්‍රාදේශීය සභාවෙන් ආපු මන්ත්‍රීවරු බහුතරයක් අද පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු වෙලා ඉන්නවා.

අධ්‍යාපනය ගන කතා කළා. අද සංඝමිත්තා විද්‍යාලයගැන කතා කළා. ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු අරගෙන සමත් වු දරුවෝ ජනප්‍රිය පාසල්වලට යනවා. ඉතුරු ළමයි ටික තමයි සියනෑවේ,කිරිඳිවැල මහා විද්‍යාලයේ,ඕවිටිගම බෝධිරාජ විද්‍යාලයේ ,සංඝමිත්තාවෙයි ඉන්නේ. ඉතරුවුනු ළමයින්ගෙන් A9 සා.පෙළ ප්‍රථිපල පෙන්වන්න මේ පාසල්වලට අපහසුයි. සියනෑ ජාතික පාසල මේ ලිස්ට් එකේ ඉන්නේ අන්තිමට. සා.පෙළ ප්‍රථිපල ලේඛනය අනුම මේ දේවල් අසාධාරණයි. දක්ෂ ළමයි පිටට ඇදලා ඉතුරු ළමයිගෙන් උසස් ප්‍රතිඵල බලාපොරොත් වන්න අමාරුයි.

පසුගිය දවස්වල හෝලි උත්සවයක් ගැන කිවුවා.අවසර දුන් ඔබතුමයි දන් වැරදිකාරයා. එතනට ළමයි එක්කගිය අම්මා තාත්තා නෙමෙයිද වැරදි. දෙමාපියන් අතේ වරද තියාගෙන ආයතනයකට බනින එක වැරදියි.

දමිත් මන්ත්‍රීතුමා කිවුවා සංඝමිත්තාවෙන් වෛද්‍යවරු බිහිකරන්න අවස්ථාව නැති බව. උපාලි ගුණරත්න මහතාගේ මැදිහත්වීමෙන් ඔතන ලක්ෂ **700** ක ගොඩනැගිල්ලක් හැදුවා. එතුමගේ පෞද්ගලික මුදල් ලක්ෂ **50** ට වඩා වියදම් කරලා.විද්‍යාගාරයක් හැදුවා පහසුකම් එක්ක.

අපි ඉස්කෝලේ යන කාලේ කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලයේ ලැබ් එක ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ විද්‍යාගාරයට වඩා පහසුකම් වලින් සමන්විත වෙලා තිබුණා. තට්ටු 3 ගොඩනැගිල්ලක් ලැබ් එකකට තිබුණා උසස්පෙළ ළමුන් සඳහා. ඒත් අද තත්වය මොකක්ද,

අද වෙනකොට අපේ බල ප්‍රදේශයේ කොට්ඨාශ 25 ,13 ට අඩු කරලා හදලා තිබෙනවා. ඔබතුමන්ලගේ පක්ෂයටයි ගැටළු මතුවන්නේ. මන්ත්‍රීවරු 25 දෙනා 13ට අඩුවනවා. ඔබතුමන්ලා දන්නෙත්නැහැ මේ විදිහට ලේබනයක් එනකම්ම. එනිසා මම ඔබතුමන්ගෙන් සනී මැතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා නැවත මහගෙදරට එන්න.

<u>ගරු මන්ත්‍රී වයි.ඒ. සරත් ගාමිණී මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, සාමාන්‍ය පෙළ ප්‍රතිඵල පිළිබඳව රාජු මන්ත්‍රීතුමත් දමිත් මන්ත්‍රීතුමත් කතා කළා. කියන්න සතුටුයි සියනෑ ජාතික පාසල A9 නැතිවුනාට A8 තිබෙනවා. මගේ පුතා පයින් ගිහින් A8 යි C1 යි ගත්තා.ඔබ පාසල පළාත් සභාවට පවරාගන්න කටයුතු කර තිබුණා. ළමයි 400 ටවැඩියා හිටියේ නැහැ. විපක්ෂනායකතුමාලා අපි එකතුවෙලා අනුරාගොඩ ධම්මාරාම හාමුදුරුවෝ සියනෑවට ගෙනත් ඒ ගේනකොට සිටි ළමයි ටික තමයි ඔය A9 ගත්තේ. 71% ක ප්‍රතිපලයක් සියනෑ ජාතික පාසලේ තිබෙනවා. ඒ පාසල ඔබතුමන්ලා තවත් ප්ලලමට දාන්න හදන්න එපා. සියනෑ ජාතික පාසල කියන්නේ විද්වතුන් බිහිවු තැනක්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා මහගෙදරට එන්න කියලා. අපි බස් හෝල්ට් එකේ සිටියත් ආයි ඔය මහගෙදරට එක අඩියක් තියන්නේ නැහැ. මිලාන් ජයතිලක මහතා පාර්ලිමේන්තුවට ඇරියෙක් අපි. අදත් අපි එතුමා එක්ක ඉන්නවා.

සියනෑ ජාතික පාසලේ හොඳ ළමයි ටිකක් ඉන්නවා. හොඳ ප්‍රතිඵලයක් පෙන්වලා තිබෙනවා. ඒ ප්‍රතිඵලය ගත්තේ අනිත් තැන්වල වගේ A9 තිබෙන ළමයි ගෙනත් නොවෙයි. ශිෂ්‍යත්වය පාස්වුනු ළමයි ගෙනත් නොවෙයි.ඒනිසා අපි A9 ගත් ළමයි ගැන නොවෙයි කතා කළයුතු. ඉස්සර ක්‍රීඩා උත්සවයක් කරන්න පොලිසියෙන් ගේන්න ඕන. ස්වාමින් වහන්සේ ආවාට පසු ඒක වෙනස් වුනා.ස්වාමින් වහන්සේ යනවා කියලා ආරංචියි. එහෙම ගියොත් ගමත් ඉවරයි. ස්වාමින් වහන්සේ ගමත් එක්ක රැකගෙන ඉන්නවා. මම කිව්වේ ඇත්ත. එනිසා මාත් එක්ක කවුරුවත් තරහා වෙන්න එපා කියමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.ල.නි.ප.)</u>

ගරු සභාපතිතුමනි, මම පැහැදිලිවම කිව්වේ සංඝමිත්තාව දොම්පෙ ආසනේ එකට ඇවිත් තිබෙන එක .ඒක ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දොම්පෙ කොට්ඨාශයේ පාසල් ටික පෙලගස්වා හදලා තිබෙන එක ගැනයි. නැතිව වෙනත් පාසල්වලට අගෞරව කරන්න නොවෙයි. එහි අන්තිමට ඉන්නේ සියනෑ විද්‍යාලය කියලයි මම කිව්වේ.

<u>ගරු මන්ත්‍රී දිමුතු ප්‍රදීප් පල්ලෙවෙල මහතා</u>

ගරු සභාපතිතුමනි, අවුරුදු 4 1/2 ක් සභාවේ හැම සභා වාරයක්ම නියෝජනය කරමින් සහෝදර මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම් සහ ඒ සියල්ලත් කැටිකරගෙන අපි නවක මන්ත්‍රීවරු විදිහට 2022 අවසාන සභාවාරයේ ඉන්නවා. ප්‍රාදේශීය සභා පණත ගත්විට අපි අහලා තිබෙන්නේ මවුකුසේ සිට මරණය දක්වා දොම්පෙ ආසනයේ ජනතාවට වගකියන ප්‍රධාන ආයතනය. එහි ප්‍රතිඵලය මේ අවුරුදු 4 තුල අපිට අත්විදින්න ලැබුනාද කියන කණගාටුව අපිට මේ වර්ෂයේ අවසාන දවසේ අපිට දැනෙනවා.

මම සභාවට පැමිණි මොහොතේම එදා වලවල් දෙක තුනක් තිබු පාරක් රැක ගැනීමට ප්‍රිමික්ස් යොදාදෙන්න කියන ඉල්ලීම මේ සභාවේ අවස්ථා 3 කදී ඉදිරිපත් කළා. අද වෙනකොට ඒ පාර ගල් ගැලවිලා විනාශවෙලා. මගේ ගේ ඉස්සරහ පාර. කාර්මික කම්ටුවේ සභාපතිතුමාගෙන් මේ සභාවෙදි මම දෙපාරක් ඉල්ලීම් විදිහට කළා. දැන් ඒ පාර තාර ගැලවිලා යන්නම බැරි තැනට පත්ව තිබෙනවා. යන්න පුලුවන් විදිහට කෙසේ හෝ සකසා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගම්න්ගමට වැඩසටහන එනවිට ප්‍රමුඛතාවය අනුව හදනවා කිවුවා. අවුරුදු 4 1/2 ක් ගිහින් පාරේ ගල් සියල්ල ගැලවිලා තිබෙනවා.මන්ත්‍රීවරයෙක් විදිහට මගේ ගේ ඉදිරිපිට පාර හදාගන්න බැරි නම් ගමේ මිනිසුන්ගෙන් එන විවේචනය ඔබතුමාට දැනෙනවා ඇති. ඒ සම්බන්ධව මැදිහත්වෙලා කුට්ටිවිල හරංකහපත පිට්ටනිය අසලින් තිබෙන පාර පිළිසකරකර දෙන්න කියා ඉල්ලා සිටිනවා.

මා ඉගෙනගත් වේරහැර බණ්ඩාරනායනක මහා විද්‍යාලය. එහි පිවිසුම් මාර්ගය හිටපු සභාපතිතුමා කාපට් අතුරු පිළිසකර කර දෙන බවට පොරොන්දුව විදුහල්පතිතුමාට දී තිබුණා. නමුත් එය ඉටු වුනේ නැහැ. ඔබතුමා ගිය වෙලාවෙත් මම මෙය හදලා දෙන්න කියා මතක් කළා. අරලිය ආයතනය ගල් කුඩු අතුරා පිළිසකරකර තිබුණා. ගිය වර්ෂාවට ගල් කුඩු හෝදගෙන වෙලට ගිහින්.

ප්‍රවාහනය ගැන විපක්ෂනායකතුමා ඇතුළු මන්ත්‍රවරුන් සභාව ඇතුලේ අදහස් දැක්වුවා. අවසාන බස් එක ඩිපෝව විසින් පාඩු ලබනවා කියා කපා හැර තිබෙනවා. විපක්ෂනායකතුමා මෙය විශේෂයෙන් සභාව ඇතුලේ මතු කළා අපේ පාරවල්වල ධාවනය වූ බස් යොදවන්න කියා. අද වනවිට නියෝජ්‍ය ප්‍රවාහන ඇමතිගේ වුවමනාව මත බෝපැත්ත පාර හරහා නිට්ටඹුව දක්වා බස් එක දාලා තිබෙනවා ඩිපෝ අධිකාරීතුමා. මෙහි බලය තිබෙන්නේ ඔබතුමාට. ළමුන්ට බුක් හයර්වල යාම අසීරු වෙලා තිබෙනවා මේ ආර්ථික ප්‍රශ්නෙත් එක්ක. උදේ බස් එක හරි ඩිපෝව හරහා ලබාදෙන්න ඉල්ලීමක් ඔබතුමාගෙන් කරනවා.

ඊළඟ වර්ෂය සඳහා මේ ප්‍රධාන වැසිකිලිය ටෙන්ඩර්දී තිබෙනවා. යන්න හැකි මට්ටමට පොදු වැසිකිලිය නිර්මාණය කරන්න කියන්න. යන්න බැරි තත්වයට එතන පත්වෙලා තිබෙනවා. ටෙන්ඩර් ගත් පුද්ගලයා දැනුවත් කරමු රු.30 ක් අයකරන එකේ පිරිසිදුව තබා ගනිමින් ඒ පහසුකම නිසියාකරව අපිට ලබාදෙන්න කියන ඉල්ලීම කරන්න. ගම්පහ,නිට්ටඹුව වැසිකිලි ගත්තත් රු.20 අරගෙන පිරිසිදුව ඒ සේවය ජනතාවට වෙනුවෙන් ලැබෙනවා. අපේ එකෙන් රු.30 ක් අරගෙනත් ඒ සේවය ලැබෙන්නේ නැතිනම් අපි ටෙන්ඩර් දෙන එකෙන් වැඩක් නැහැ. ඔබතුමා මැදිහත්වෙලා හෝ එයට යන්න පුලුවන් මට්ටමට හෝ නිර්මාණය කරන්න කියන ඉල්ලීම කරනවා.අද දවසේ අධ්‍යාපනය ගැන කතා කළා. අපි සභාවක් විදිහට අපේ මනුෂ්‍ය ජීවිතය රැකගන්න අපිට ඕන කැලරි ටිකක් තිබෙනවා. අපිට එය ලැබෙන්නේ නැති තැනත තිබෙන්නේ. අපි සභාවක් විදිහට මේ සියල්ල සපුරගන්න ගන්න ක්‍රියා මාර්ග මොනවද ගන්නේ කියන එක ඊළඟ වර්ෂයට සැලසුම් කරමු.

අධ්‍යාපනය ගැන ගොඩක් කතා කළා. A3 ගත් ළමයෙකුටවත් කැම්පස් එක විවර වන්නේ නැතිනම් අප රටේ අධ්‍යාපනයේ ඛේදවාචකය. මෙහි වරද ඒ සඳහා ප්‍රතිපාදන කප්පාදුවෙලා තිබෙනවා.අපේ රටේ ප්‍රතිපාදන වෙන්නොවන තාක්කල් මේ අර්බුදය තිබෙනවා. මේ අධ්‍යාපනය තුල අපේ ළමයින්ටත් ඒ සියළු අත්දැකීම් අත් විඳින්න වෙලා තිබෙනවා. පාසල්වල මට්ටම තර්ක කළාට වැඩක් නැහැ. අධ්‍යාපනය වෙනුවෙන් අයවැයෙන් කොහොමද වෙන් කරන්නේ කියන කාරණය සිදුනොවන තාත්තල් අපේ අධ්‍යාපනය ඉදිරියට යන්නේ මේ විදිහටයි. පාසල් කුල ගැටුමකට වඩා සියළු දරුවන්ගේ අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් අපිටත් ගතහැකි ක්‍රියා මාර්ගයක් වේනම් ලබන වර්ෂයේ ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරනවා.

ගමේ පාසලට අධ්‍යාපනයට නැතිනම් ගමේ රෝහලට බෙහෙත් ටික නැතිවෙනවානම් අපි කරපු මේ දේශපාලනයේ ප්‍රතිවිපාක මේ රටේ ජනතාව භුක්ති විඳිනවානම් එයට ගැලපෙන විදිහට අපේ දේශපාලන වුවමනාව වෙනස් කරමින් ඒ සඳහා මැදිහත් විවයුතුයි. ඒ වෙනුවෙන් පක්ෂයක් විදිහට මේ රට ගොඩනගන වැඩ පිළිවෙලක් එක්ක ඉදිරි මැතිවරණයට එළඹෙනවා කියන පණිවිඩය දෙමින් සියළුදොටම ලබන්නාවූ නව වසර සුභ නව වසරක් වේවායි පතමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.කරුණාජීව මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, අද දින අපේ ගරු සභාවේ 2022 වර්ෂය අවසාන සභාව. මන්ත්‍රීවරයෙක් විදිහට මේ සභාවට ඇවිත් වසර 5 කාලයක් සභාව නියෝජනය කරලා 2022 වසරේ අවසන් සභාව .අපි මේ සභාව තුල සියළුදෙනා කතා කළේ මේ සභාවට තුලින් ජනතාවට වියයුතු යුතුකම් සහ වගකීම් කියන කරුණු කාරණා පදනම් කරගෙනයි.

(ගරු සභාපතිතුමා මදකට සභාවෙන් ඉවත්ව ගිය අතර ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් මුලාසනය හොබවන ලදී)

අපේ රාජු මන්ත්‍රීතුමා අධ්‍යාපනය,ක්‍රීඩාව,යටිතල පහසුකම් සහ අනිකුත් දේශපාලන ව්‍යුහයන් ගැන විශේෂයෙන් කතා කළා. අධ්‍යාපනය ක්ෂේත්‍රයේ ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනය ගත්තොත් මේ රටේ පැවති ආණ්ඩු ගත් තීරණ අනුවයි මේ අධ්‍යාපන මට්ටම අද රටේ පවතින්නේ. අපි සැහ මොහොතකම ප්‍රාදේශීය මට්ටමෙන් දේශපාලනය කරනවිට ඉහල ආණ්ඩු හදන අයට අවශ්‍යවන්නේ ප්‍රාදේශීය නායකයින් ඒ කාල වකවානුවට විතරයි. ඊට පස්සේ ආණ්ඩු හදලා ජනාධිපති පත්කර එතනට යවලා සියළු දේවල් කළාට පසු පිඹුරුපත් සියල්ල ඒ ඉහල මැති ඇමතිවරුන් හදනවා ජාතික ප්‍රතිපත්තියක් නැතිව. ඒ නීතිරීති අනුවයි අද මේ අධ්‍යාපන ක්ෂේත්‍රය කඩා වැටී තිබෙන්නේ.ඒ පවතින අධ්‍යාපන ඇමතිතුමා ගන්න තීරණ අනුවයි මේ අධ්‍යාපනය මේ තත්වයට පත්ව තිබෙන්නේ. අපේ තිබෙන පොඩ ඉතිහාසය වල දාලා තිබෙන්නේ එතනින්. මෙයට වග කිවයුතු දෙමාපියන් නොවෙයි. ආණ්ඩුවල හිටපු මැති ඇමතිවරුයි. දරුවා මමත්වය තුලින් ගිහින් තිබෙනවා. අපේ කියන පොදු හැඟීමක් නැහැ. අධ්‍යාපනය තුලින් දරුවන් ඉහලට ගේන්න නම් ජාතික ප්‍රතිපත්තියක් තුලින් අධ්‍යාපනය හැදිය යුතුයි. පෙළපොත අද දරුවන් කියවන්නේ නැහැ. කියවීම නැතිකර තිබෙනවා . අද දරුවන් උපකාරක පන්තිවලට ඇබ්බැහිකර තිබෙනවා. පන්ති නොගිය දරුවට ඉහලට යන්න බෑ කියන මතයට පත්කර තිබෙනවා. පෙළපොත අනුව විභාග ප්‍රශ්නපත්‍ර ටික පිලිවෙලකර දුන්නොත් ඒ අනුව විභාගවලට මුහුන දුන්නොත් ඒ දරුවන්ට එතනට යන්න ක්‍රමවේදය මේ රටේ හැදුවොත් මිසක් නැතිනම් මේ උපකාරක පන්ති තුලින් මේ දරුවන්ට යන්න බැහැ. අපි අද දුක් විදින්නෙත් ඒ උපකාරක පන්ති නිසා. භෞතික සම්පත් සංවර්ධනය පමණක් ගෙනයන්න විදුහල්පතිවරු ගුරුවරු දෙමාපියෝ කැටුව බලනවා. එය අවශ්‍යයි නමුත් තරගකාරීව මෙය ගෙනයන්න බලනවා.

අද මේ රට මුහුනදීලා තිබෙන ව්‍යසනය තුල අද පවතින ආණ්ඩුව මේ රටේ මිනිසුන්ගේ ආර්ථික ගැටලු මොනවා තිබුනත් මොන විදිහකින් හරි මේ තිබෙන ගැටලුවලට මේ ජනතාවට පීඩනය කොච්චර ආවත් අරගෙන යන්න උත්සාහ කරනවා. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු හැටියට අපි දකින්නේ එය ඉදිරියට මොන විදිහකින් හෝ සුභදායි තත්වයට මේ රට යන්න නම් සියළුම මහජන නියෝජිතයොත් එකතුවෙලා රටේ ජනතාවත් කැපවෙලා යම් තැනකට ආවොත් පමණයි මේ රටට ඉස්සරහට යන්න පුලුවන්. මේ දරුපරපුරට මේ රට දායාද කරන්න පුලුවන් වෙන්නේ එතනට ආවොත් විතරයි.

කඩදාසියක් පෙන්වලා අපේ ඉදිරි ගමන සහ දැක්ම මොකක්ද කියලා සඳහන් කළා.මගගෙදර අපිට එපා කළේ කවුද ඔබතුමාලගේ නායකයින් එදා. නැවත මගගෙදරට ආරාධනා කරනවා කියා ඔබතුමා සඳහන් කළා. අපිට ආරාධනා කරන මහගෙදර හොරගොල්ලේ මහගෙදරද, පොලොන්නරුවේ මහගෙදරද නැතිනම් මාතර මහගෙදරද කියලා මම අහනවා. මේ සමාජයට ආදර්ශ නායකයෝ බිහිවන මේ දොම්පෙ ආසනයේ ඉදිරියටත් අපි සියළුදෙනා එකතුවෙලා ලබන වර්ෂයේ අපිට මැතිවරණ ආවත් නාවත් සභාපතිතුමා රාජ්‍ය නිලධාරීන් සහ අපි සියළුදෙනා එක්ව දොම්පෙ ආසනය තුල ජනතාවට සුභදායි වැඩ කටයුතු ඉටුකර ජනතාවාදී දේශපාලනයක සිටිමු යැයි මම සියළුදෙනාගෙන් ඉල්ලා සිටිනවා. ලබන්නාවූ නව වසර ඔබ සියළුදෙනාටත් පවුල්වල සියළුදෙනාටත් සුභ නව වසරත් වේවායි කියා පතනවා. සභාපතිතුමාට සහ අපි සියළුදෙනාටම සහය දැක්වූ ලේකම්තුමා අද අසනීපව ඉන්නවා ඒ සිය පවුලටම ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා. ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලයේ සියළුදෙනාටත් සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රීවරුන්ටත් ලබන වසර සුභ නව වසරත් වේවා කියා පතමින් මම නිහඬවනවා. තෙරුවන් සරණයි.

(ගරු සභාපතිතුමා නැවත සභාවට පැමිණ මුලසුන හොඹවන ලදී)

<u>ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මේ වසරේ අවසාන සභාවයි අපි මේ සහභාගි වන්නේ. 2021 දෙසැම්බර් මාසයේ 2022 අවුරුද්දට සුභපැතුම් මේ විදිහටමයි ඒත් 2022 අවුරුද්දේ මොනවද වුනේ කියලා ඔබතුමන්ලා දන්නවා. මිනිස්සුන්ට ඕන දේවල් නෙවෙයි දේශපාලඥයින්ට ඕන දේවල් තමයි වුනේ. මේ ක්‍රමය වෙනස් වෙලා අළුත් විදිහට සභාව හැදෙන්න ඕනෑ ලබන අවුරුද්දේ. ගමේ සංවර්ධනයට ඕන ව්‍යාපෘති යෝජනා නෙවෙයි දේශපාලඥයාට ඕනෑ ව්‍යාපෘති යෝජනායි කරන්නේ. එවිට තමන්ට වැඩක් වෙන්නේ නැහැ.

ඒවගේම අධ්‍යාපනය ගැන කතා කළා. දැන් විශ්ව විද්‍යාලවලට වෙලා තිබෙන්නේ මොනවද, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කුලපතිට ගහලා, ගෙවල් කඩලා, ළමයින්ට ගහලා මේකද අධ්‍යාපනය මම අහන්නේ. අන්තරේ කියන්නේ මොන දේශපාලන පක්ෂයද, ජ.වි.පෙ. නෙවෙයි නම් මෙය අපේ නොවෙයි කියලා කියන්න .

අනුර කුමාර මහත්තයට ඒ ගැන ප්‍රකාශයක් කරන්න කියන්න. මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වෙනවානම් පාසල් ළමුන් හරහා ඒවා වලක්වන්නයි ප්‍රමුඛතාවය දියයුතු. මේ හැමදෙනාම ගෝඨාභය රාජපක්ෂ මහතා දිනවන්න පෙළපාලි ගිය ජන්දය දුන් අය. ඒ ගොල්ලොම කියනවා අපිට වැරදුනා කියලා. එනිසා ජ.වි.පෙ.ට මම කියනවා අන්තරේ අපේ නොවෙයි කියලා නිදහස් වෙන්න. මේ ගැහුවේ මේ ගොල්ලෝ වෙනම පක්ෂයක්. නැතිනම් පෙරටුගාමී කවුරු වුනත් මේ දේ භංගගෙන ඉන්න එක වැරදියි. මේවාට උපරිම දඩුවම් කරන්න කියා මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සියනෑ ජාතික පාසල ගැන කතා කළා. සියනෑ ජාතික පාසල ඔය තත්වයට ගේන්න සියළුදෙනා මහන්සි වුනා.විශාල සංවර්ධන කටයුතු යහපාලන ආණ්ඩුව කාලේ කළා හර්ෂණ රාජකරුණා මැතිතුමා. ආණ්ඩුව පැරදුන නිසා ඉතිරි වැඩ ටික කරන්න බැරි වුනා. ධම්මාරාම හාමුදුරුවෝ විදුහල්පතිවෙලා විශාල වැඩ කොටසක් කළා. දැන් ඒ හාමුදුරුවෝ විශ්‍රාම යනවා. අළුත් ස්වාමින් වහන්සේ නමක් විදුහල්පති වශයෙන් නම් කරලා තිබෙනවා. සරත් ගාමිණී මන්ත්‍රීතුමා කතා කරලා ගෙන්වාගන්න, දඹෝරේ හාමුදුරුවෝ එකඟ වුනා පාසලට එන්න. පාසල හදන්න අපි හැමෝටම යුතුකමක් තිබෙනවා. සංඝමිත්තා පාසල ගැනත් කතා කළා. මේ පාසල හදන්න මූලික වෙලා කටයුතු කළේ සුරනිමල රාජපක්ෂ මැතිතුමා බව ඔබතුමන්ලා කාටවත් මතක නැහැ. මෙතන මේ පාසල හදන්න එපා කියා එදා පුදුම විරුද්ධතාවයක් තිබුණා. සංඝමිත්තාව මෙතන දාන්න දුන්නේ නැහැ. පසුව මම තමයි මෙයට මැදිහත් වුනේ. දැන් පුද්ගලික අංශවල ගුරුවරු තමයි මේ ප්‍රතිඵල ගන්න 80% ක්ම වෙර අදින්නේ. ඒ ගැන කවුරුවත් කතා කරන්නේ නැහැ. ඉස්කෝලෙටමයි සේරම ගොරවය යන්නේ. අද ඉස්කෝලවල උගන්වන්නේ නැහැ. ගෙදරට ඇවිත් පන්ති කරන්න දාගන්නවා.

දැන් යහපාලන ආණ්ඩුව කාලේ අපි කරන්න හැදුව දේවල්වලට පනයනකම් බැන්නා. ඒත් දැන් ඒවා කරන්න හදනවා. උතුරට දැන් බලය බෙදන්න හදනවා. එහෙම නොකලොත් ඉන්දියායෙන් ණය දෙන්නේ නැහැ. ඇමරිකාවන් දෙන්නේ නැහැ. මේවා කළාට පස්සේ තමයි ණය ලැබෙන්නේ. දොම්පෙ මාර්කට් එක ගැන කතා කළා. අපි සැලැස්ම හදාගෙන ආවා. මන්ත්‍රීවරු 7 යි සිටියේ ආණ්ඩුව පෙරලුනා. දොම්පෙ ප්‍රශ්නය ගැන සොයා බලන්න.

පුගොඩ පොලිසියට දැන් හොඳ OIC කෙනෙක් ඇවිත් ඉන්නවා. කවදාවත් කරන්න බැරි වුන පුගොඩ ටවුන් එකේ කුඩු ඇල්ලුවා. එක OIC කෙනෙක්වත් ඒක කලේ නැහැ. මෙයා තවම ඉන්නේ වැඩ බලන්න. එනිසා මේ සියළුදෙනාම පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ලිඛිතව ඉල්ලන්න ස්ථිරවම මේ නිලධාරියාට පුගොඩ පොලිසියට ලබාදෙන්න කියලා. දේශපාලනයක් ගන්නේ නැහැ. එතුමා හරියට රාජකාරිය කරනවා.

රෝහල්වල බෙහෙත් නැති එකට රජය විශේෂ අවධානය යොමු කළයුතුයි. අපේ ගේ ළඟත් කෙනෙක් දොම්පෙ රෝහලට යනකොට හර්දයාබාධයක් හැදිලා රෝහලේ බෙහෙත් නැහැ. මේවගේ දේවල් හැමතැනම වෙනවා.

අපේ යහපාලන ආණ්ඩු කාලයේ මාලිගාවත්තේ පාසලක් හදන්න කටයුතු කළා. ලක්ෂ 1000 ක් වෙන් කළා. අංග සම්පූර්ණ නවීන පාසලක් ඔබතුමන්ලාගේ කාලේ ඒක නැතිව ගියා. ලබන අවුරුද්දේ හරි ඊළඟ අවුරුද්දේ හරි අපි ලෑස්තියි ජනාධිපතිතුමා අනුමැතිය යටතේ ඒ පාසල හදන්න පටන් ගන්නවා. මම එදා කැරගල ඉඩමේ විශ්ව විද්‍යාලය හදන එකේ ලියුම අරින්න කියා කිවුවා. තව වෙනකම් ඒ ලියුම ඇරියේ නැහැ. කැරගල පිට්ටනියේ පෙරපාසලක් හදනවා කියලා ආරංචියක් තිබෙනවා පෙරපාසල එතන ගත්තොත් සතියේ දවස් 5 එතන මොකුත් කරන්න වෙන්නේ නැහැ. පොළ දාන්නවත් කානිවල් කරන්නවත් ලැබෙන්නේ නැහැ. පෙරපාසල හදන්න ඉඩමක් තිබෙනවා ඔය හරියේ. පුටුපාගල පටන් ගන්න තැනම ඥානක්කගේ කඩය ඉස්සරහ වෙන්දේසි කැල්ල හරියේ. ඒ ගැන අවධානය යොමු කරන්න.

සනී ජයවර්ධන මැතිතුමා කාපට් පාරවල් ගැන කතා කළා.පාරවල් භාගෙට නතර කර තිබෙනවා කරන්නේ නැතිව. වෙඩිසිංහ මන්ත්‍රීතුමාගේ පැල්පිට කන්දවෙත්ත පාර නැවතිලා තිබෙනවා. තවත් පාරවල් ගණනාවක් කරලා නැහැ. 2015 දී දාපු කොන්ක්‍රීට් පාරවල් ඇරෙන්න අනිත් සියලු පාරවල් කැඩිලා. අපි හරි ප්‍රමිතියට පාරවල් කොන්ක්‍රීට් දැමුවා. මේ කැඩුනු පාරවල්වලට තාර කෝඩ් එකක් ගැහුවොත් යම් ප්‍රමාණයකට කැඩෙන එක නවත්වගන්න පුලුවන්. ඉද්දමල්ගමට යන පාරේ යන්න බැහැ. ඒවා හදන්න. මේවා ගැන සංඛ්‍යා ලේඛන අරගෙන වැඩ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් 2023 නව වසරට සියළුදෙනාටම සුභ ප්‍රාර්ථනා කරනවා.

**2022.12.15 දින පැවති මාසික සභා රැස්වීම**

<u>ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ලබන්නාවූ නව වසර සියලුදෙනාටම ජයග්‍රාහී නව වරසක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. විපක්ෂනායකතුමා සමහ වෙලාවට විහිලු සපයනවා. විපක්ෂනායකතුමාට විරුද්ධව වචනයක්වත් කියන්න මම කැමති නැහැ. මට එක වෙලාවකට ගුරුන්නාන්සේකෙනෙක් වුනා. එක වෙලාවකට හොඳ දේශපාලනය කරපු කෙනෙක් වුනා. ප්‍රාදේශීය සභාවට ආදර්ශයක් වුනු හොඳ නායකත්වයක් දරපු සභාපතිවරයෙක් වුනා. අපි ඉතිහාසය අරගෙන බැලූ විට ඉතිහාසයේ හැමදාම වැඩකරපු අය පරාජය කරලා ගෙදර ඇරපු ආසනයක් තමයි දොම්පෙ ආසනය.සුරනිමල රාජපක්ෂ ඇමතිතුමා ගැන කතා කළා. එතුමා පාසල් වෙනුවෙන් දරුවන් වෙනුවෙන් විශාල කැපකිරීම් කරපු කෙනෙක්. එතුමගේ ආකල්ප තමයි විපක්ෂනායකතුමා ගාවත් තිබෙන්නේ. දොම්පෙ මන්ත්‍රීතුමිය හිටපු සභාපතිතුමා කරපු දේවල් ගැන කතා කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මොන මට්ටමේ සිටියත් ඒ ගොල්ලේ මොනවා හරි දෙයක්කර තිබෙනවා. යන්න බැරි පාරවල්වලට කරන්ට් එක අරන් දුන්නා සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමා. උපාලි ගුණරත්න මැතිතුමා සංඝමිත්තාවේ දරුවෝ වෙනුවෙන් කතා කරලා යම් දෙයක් කළා. හර්ෂණ රාජකරුණා මැතිතුමා යම් දෙයක් කළා. සුරනිමල රාජපක්ෂ මැතිතුමා මේ හැමෝටම වඩා දෙයක් කළා.අපිටත් අත්දැකීම් එන්න ටික කාලයක් යනවා. දන් රාජු මන්ත්‍රීතුමා කිවුවා මේ පක්ෂයට ඔක්කොටම එන්න කියලා. එක්දහස් නවසිය අනුගණන් වලින් පස්සේ කවුරුවත් මේ පක්ෂයෙන් ජන්දය ඉල්ලුවේ නැහැ. එල්ලිච්ච පක්ෂයෙන් තමයි ජන්දය ඉල්ලුවේ. මම රාජු මන්ත්‍රීතුමාගෙන් අහනවා ශ්‍රී.නි.ප. ය ජන්දය ඉල්ලුවේ හංසයාගෙන් නෙමෙයිද කියලා. දෙපැත්තෙන්ම සිදුවුනේ මේ දේ තමයි.

සියනෑ පාසල ගැන කතා කළා. සරත් ගාමිණී මන්ත්‍රීතුමා එහෙම සියනෑ ජාතික පාසල ගොඩගන්න කැපවීමෙන් කටයුතු කළා. ඕවිටිගම,පැපිලියල භාර නොගත් දරුවෝ ගණනාවක් මම ඔය හාමුදුරුවෝ එක්ක කතා කරලා සියනෑවට දැමුවා. දන් හාමුදුරුවෝ විශ්‍රාම යන්න සූදානම් වෙනවා. මේ තත්වයට මේ පාසල ගෙනාපු එක ගැන ඒ හාමුදුරුවන්ට ස්තුතවන්තවෙනවා. වැඩ බැරි ළමයින්ට උගන්වලා ඉහලට ගත් පාසලක් කියන්න ඒ සියනෑව විතරයි.

හෝලි උත්සවය ගැන කතා කළා. ගෙදරින් ළමයෙක් පිට වෙනකොට අම්මා තාත්තා මේ කොහෙද යන්නේ කියා බැලිය යුතුයි. හැමදේම වුනාට පස්සේ සභාපතිවරයාට දොස් කියා වැඩක් නැහැ. මිනිසුන්ට හරිම අමාරු කාලයක් උදාවී තිබෙනවා. කොවිඩ් අපි කවුරුවත් ගෙනා දෙයක් නොවෙයි. අද හැමෝම කරලා තිබෙන්නේ ජන්දෙ ගන්න බොරු කිපයු එක. අපේ වයසත් එක්ක තව කොච්චර කාලයක් ඉදීද කියා දන්නේ නැහැ. නවක මන්ත්‍රීවරුන්ට අපෙන් උපදෙස් අරන් මේ සභාව අනාගතයේදී ඉස්සරහට අරගෙන යන්න පුලුවන්.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

අද රටේ දැවෙන ප්‍රශ්න,ආසනයේ ප්‍රශ්න දීර්ඝ වශයෙන් කතා කළා. දොම්පෙ සතිපොළෙන් මන්ත්‍රීතුමිය පටන් ගත්තා. මෙය අනවසර ඉදිකිරීමක්. පසුගිය අවවැය දවසේ දවල් කාලයේ මෙය සිදුව තිබෙනවා. වහාම ඉවත් කරන්න කියා උපදෙස් දුන්නා. පොලිසිය දාලා ඉවත් කරන්න හදනවිට වෙනත් පාර්ශවයක් මෙයට මැදිහත්වෙලා. මාළු කඩේ ඩීපීසරය එහෙම තියාගන්න ඕනෑ නැතිනම් හොරු ගෙනියනවා එනිසා දොරක් දානවා කිවුවා. එහි නීතිවිරෝධී ක්‍රියාවක් වෙලා තිබුනත් එය පසුව එම හේතු මත සාධාරනීකරණය වුනා.

පරණ පොළේ බට ටික තහඩු ටික වික්ක බව කිවුවා. පරණ පොළ ගලවලා එහි තිබූ තහඩු සහ බට ප්‍රාදේශීය සභාවෙන් ප්‍රජා මණ්ඩලවලට සහ මෙහි සිටින නිලධාරීන්ට සහ ඉල්ලපු අයට සහන මිල පදනම යටතේ ලබාදුන්නා.

ලක්ෂ 2 කි විතර ආදායමක්ද ලැබුණා.එක් අයෙකුට තහඩු 10 කට වාඩා දුන්නේ නැහැ. මම නම් එක කැල්ලක්වත් මුදලටවත් ගෙන ගියේ නැහැ.

විදිපහන් ප්‍රශ්නය ගැන කිවුවා. මම ගිය සභාවේදී පැහැදිලිව කිවුවා උපකාර්යාල 4 ම කණ්ඩායම් එක සෙනසුරාදා දවසක දාලා එක මන්ත්‍රීවරයෙකට දෙන්න පුලුවන්, ලැස්ති කරගන්න කියා. නමුත් 43 දෙනාගෙන් එක් අයෙක්වත් ලැස්ති කරගත්තේ නැහැ. සභාවේ කතාකර විතරක් හරියන්නේ නැහැ. වැඩකරන තැනකුත් කරගතයුතුයි. එය සියළුදෙනා එකතුවෙලා සාමූහික වගකීමෙන් ලබන අවුරුද්දටවත් ඒ කටයුතු ලෑස්ති කරගන්න. මන්ත්‍රීවරුන් ඒ සඳහා සම්බන්ධ වෙන්න කියා මතක් කරනවා.

ඉඩම් වෙන්දේසිය ගැන කතා කළා. මයිලෑන්ඩ ගැන කාලයක් කතා කළා කිවුවා. මේ ඉඩම් වෙන්දේසි කිරීමේදී අපි මුලින්ම දෙනවා කොන්දේසි ලියුමක්.

ඒ කොන්දේසි ඉටුවු පසුයි අපි අනුමැතිය දෙන්නේ. එවිට ඒ මිනිස්සු බලන්නෙත් අඩුම වියදමකින් මෙය කරගන්න. ඉඩම් වෙන්දේසියේදී සිදුවන කටයුතු පෙරට වඩා සාර්ථකව කෙරෙනවා. මීට අවුරුදු 10 කට එහා වෙන්දේසි කරපුවත් අද වෙන්දේසි කරපුවත් සොයා බලන්න. සියළු දේවල් හරියට කරලා නැතිනම් අනුමැතිය දී නැහැ.අනුමත නොකරන වෙන්දේසි කීපයක් තිබෙනවා. SJ ප්‍රොපටී.එහි එක ප්‍රශ්නයක් මානව හිමිකම් කොමිසමටත් ගියා.ඒ අය ලොකු වෙන්දේසි කරන්නේ නැහැ. කැලි 7,8 ගන්නේ. කැලි කඩලා හොරෙන්ම විකුණනවා. ඒ එකක්වත් අද වෙනකම් අනුමත කර නැහැ. මයිලැන්ඩ් එකත් අද වෙනකම් අනුමත කර නැහැ. අපි කියන දේ උපරිම කරපු ගමන් මේ හරියේ ගම් ඇතුලේ පර්ච් එකක් ලක්ෂ 4,5 ක් වෙනවා. ඒනිසා අඩුපාඩු ඇතිව කරන්න දෙන්නෙත් නැහැ. මේනිසා මෙය බරපතල ප්‍රශ්නයක්. දැඩි අධීක්ෂණයක් කරනවා. නමුත් අඩුපාඩු නැහැ කියන්නේ නැහැ.

පාසල් අධ්‍යාපනය ගැන කතා කළා. කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලයේ තත්වයට හේතුව මේ අධ්‍යාපනය පිළිබඳ ගන්න වැරදි තීන්දු. ඉස්සර අපි පාසල් යන කාලේ 6 වසරට ගත්තේ විභාගයක් තියලා පාස් වුනු ළමයි. දැන් එය පොකුරු පාසල්, පර්ෂධ මුලස්ථ කියා කොහොමහරි ඉස්කෝල එකතුකර තිබෙනවා. කිරිඳිවැල මධ්‍ය මහා වි.ට 5 න් පසු පංති නැති කුට්ටිවිල කණිෂ්ඨ විද්‍යාලය,බණ්ඩාරනායකපුර කණිෂ්ඨ විද්‍යාලය, පිංගමුව කණිෂ්ඨ විද්‍යාලය යන පාසල්වල ඔක්කෝම ටික මේකට එනවා. අකුරු ලියන්න බැරි ළමයිනුත් 6 ට එනවා. අධ්‍යාපනයේ ප්‍රතිඵල ප්‍රතිශතය මනින විට අර අයත් එක්කයි මෙය හදන්නේ .ඊට පස්සේ ලකුණු හොඳ නැහැයි කියනවා. දැන් උසස් පෙළ විද්‍යා පන්ති තිබුනේ කිරිඳිවැලත් දෙකටන පද්මාවතියෙත් පමණයි. ඒවාට ළමයි එන්නැති විට ඒවායේ හොඳ ගුරුවරු ඉන්නේ නැහැ. එවිට ඒ ගුරුවරු ප්‍රතිඵල හොඳ ඉස්කෝලවලට යන්න කැමතියි. ඒවායේ ගියහම ඒ ගුරුවරයාට ටියුෂන් මාර්ගය හැදෙනවා. කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලය අලස් මහත්තයා

ට දෙන විට එයා ආනන්ද විද්‍යාලයේ උපගුරුවරයෙක්. ජේ.ආර්.ජයවර්ධන මහතා අලස් මහත්තයාට මෙය දෙන්න කියා තිබෙනවා එයා කරයි කියා. ඩී.එස්.එක පටන් ගත්තේ එහෙමයි. අන්තිමයට ලංකාවේ ප්‍රධාන පාසලක් වුනා. පසුකාලීනව විදුහල්පති වුනාට පසුයි ඔහු උපාධිය ලබාගත්තේ.කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය ඊ.ඩබ්.අධිකාරම් පටන් ගන්න විට ඔහුගේ වයස අවුරුදු 23යි.

නමුත් පොඩියට පාසල පටන් අරන් ලංකාවේ ප්‍රධාන පෙළේ පාසලක් බවට පත් කළා.මේවගේ දක්ෂයන්ට තැන නොදී සහතිකයට තැන දීම සමස්ථ පරිපාලනය අධ්‍යාපනය සියල්ලක්ම කඩා වැටිලා. සී.ඒ.එස්. පාස් නම් කනෙක්,කොරෙක් අබ්බගාතයෙක් වුනත් කමන් නැහැ ප්‍රාදේශීය ලේකම්කම දෙනවා. අධ්‍යාපන පරිපාලන විභාගය පාස්වුනු හුඟක් අය ළමයින්ට උගන්වන්නේ නැතිව තමන් විභාග කරපු අයයි.

භාගෙට හදපු පාරවල් ගැන කිවුවා. කාපට් කරන්න කියලා පාරවල් බර ගණනක් තියන ඒවත් කැපුවා. ඩෝසර් කළා. මෝටර් ග්‍රේඩරයෙන් අල්ලලා ABC දාලා තලලා ගියා. සමහර ඒවායේ ABC භාගෙට දැමුවා. දැන් තිබුණාට වඩා අන්තවෙලා තිබෙනවා. වැලිවත්ත පාර හොඳට තිබුණා. කාපට් කරන්න කියා කැපුවා. දැන් තිබුණාට වඩා අන්තයි. දැන් ඔක්කොම ප්‍රශ්න ප්‍රාදේශීය සභාවට. ග්‍රාමීය මාර්ග සංවර්ධන අමාත්‍යාංශය කියා නිමල් ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශයක් තිබුණා.ව්‍යාපෘති එව්වා. අපි නම් කළේ ව්‍යාපෘති 10,15 යි. දිවුලපිටියේ ව්‍යාපෘති එකසිය තිස් ගානක් කරලා. සල්ලි වෙන්කරලත් නැහැ. මේවගේ ක්‍රමවත් සැලැස්මක් නැතිව මුදල් වෙන්නොකර ව්‍යාපෘති කරනවා. අන්තිමට සල්ලි නැහැ. කාපට් කිරිල්ලත් එවැනි තත්වයක් තිබෙන්නේ. මේවා සියල්ල ප්‍රාදේශීය සභා පාරවල නිසා අන්තිමට වගකියන්න වෙන්නේ ප්‍රාදේශීය සභාව.

අපේ ප්‍රිමින්ස් ඒකකයට ගැටළුවක් තිබෙනවා. අනන්නෙත් පටවන්නෙත් සවලෙන්. මෙය පටවා ඉවර වෙනකොට 11,12 වෙනවා.මම මෙවර අයවැයට ලෝඩරයක් ගන්න යෝජනා කළේ එනිසයි. එය ගත්තාතට පසු ටිකක් කාර්යක්ෂම වෙයි තිබුණාට වඩා. ප්‍රිමික්ස් එකේ සේවකයින්ගේද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අයට ගෙවන්නේ දවසකට රු.1600/ යි. සෙනසුරාදා,ඉරිදා එන්නේ නැහැ පිට වැඩවලට යනවා රු.2500/- පඩියට.මෙවැනි ප්‍රායෝගික ප්‍රශ්න මැදයි මෙය කරන්නේ. ඒත් මෙය කොහොමහරි කරගෙන යන්න උපරිම උත්සාහ කරනවා.

අපේ මධුර සංජීව මන්ත්‍රීතුමා දොම්පෙ නගරයේ සැලසුම් ගැන කිවුවා. අපේ මේ සැලසුම්වලට ලොකුම බාධාව තමයි නාගරික සංවර්ධන අධිකාරිය. දොම්පෙ පොළට වියදම් කළ සල්ලි වලින් මුළු දොම්පෙම හදන්න තිබුණා.

පුගොඩ කැරගල් මාවත අත්‍යාවශ්‍ය මාර්ගයක්. එහි වතුර හිරිනවා. ගංවතුර කාලයට යන්න බැහැ. එයට තාවකාලික විසඳුමක් ලබාදෙන්න කටයුතු කරනවා.

අපේ දිමුතු මන්ත්‍රීතුමා ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කළා. බස් ප්‍රශ්නය බරපතල ප්‍රශ්නයක්. ඩිපෝව කියන්නේ සේවා කරන ආයතනයක්. ඒ අයට දී තිබෙන ඉලක්ක තමයි සේවා සැපයීම නොවෙයි ලාභ ලැබීම. ඩිපෝවේ පඩි ගෙවාගන්න බැරි නම් කියන්නේ ඩිපෝව බංකොලොත් කියලයි. එනිසා ඩිපෝවේ පාලන අධිකාරිය කරන්නේ වැඩිය සෙනග ඉන්න පාරවල්වල දුවලා ආදායම සෙවීම.මේ ප්‍රශ්න ගැන කතා කරනවා. නමුත් විසදෙන පාටක් නැහැ.

කිරිඳිවැල වැසිකිලිය ගැන කතා කළා. මේ පොදු වැසිකිලිය ප්‍රතිසංස්කරණයට විශාල මුදලක් යනවා. අපි එනිසා එය එතනින් ඉවත් කරනවා. ජරාවාස වෙලා. ඔක්කොම ජනතාව ගැවසෙන තැන එතන. පොල පිටුපසින් අළුත් වැසිකිලියක් හදන්න පටන් ගන්නවා. ඊට පසු ඒ වැසිකිලිය එතනින් ඉවත් කරනවා.

විපක්ෂනායකතුමා ක්‍රම වෙනස් කිරීම ගැන කතා කළා. ක්‍රමය වෙනස් කරන්න ඕනෑ අපි. මෙච්චරකල් මේ රටේ මිනිස්සු ක්‍රමය වෙනස් කළේ නැහැ. මේ රටේ වැඩක් කරන්න ආණ්ඩු හදලා නැහැ. තියන එක පරද්දන්නයි ඡ්දේ දි තිබෙන්නේ. ගන්න කෙනා ගැන හොයන්නේ නැහැ. දැන් වුනත් එහෙමයි. පොහොට්ටුව පරද්දන්න තමයි ඕන. එන්නේ කවුද කියා ඉලක්කයක් නැහැ. මිනිස්සුන්ට ලොකු වගකීමක් තිබෙනවා. අපි ගේන්නේ කුවද කියන එක ගැන සොයන්න. ඉන්න අය පන්නන්නේ හොරකම් නවත්වන්න. ඉපයීමක් ගැන කවුරුවත් කතා කරන්නේ නැහැ. රටේ ආර්ථිකය නගා සිටුවීමේ වැඩ පිලිවෙල ගැන කතා කරන්නේ නැහැ. එනිසා වැඩ පිලිවෙලකුත් එක්ක මෙය ආයුතුයි.

කැරගල අපේ පෙරපාසල හදන ඉඩම ළමා උද්‍යානයක් තිබුනා. එය භාවිතා කළෙත් නැහැ. එය අභාවයට ගිහින් තිබුණා . එය වෙන්වෙලා තිබුනු කොටසක්.

පෙරපාසල වෙන ඈතකින් හැදුවොත් යන්න එන්න ප්‍රශ්නයක් තිබෙනවා. ළගින්ම හැදුවේ එනිසයි. විපක්ෂනායකතුමා කිවු ප්‍රශ්නය අපිට දැනුනා. බෝල ගහනකොට ස්පීකර් දානකොට ශබ්දයක් එන්න පුලුවන්. නමුත් සතියේ දිනවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා වෙනවා ඉතා අඩුයි. පෙර පාසලක අවශ්‍යතාවය කැරගල තිබෙන නිසයි එය කළේ. පුගොඩටත් අපි සල්ලි වෙන්කලා . නමුත් අපි පෙරපාසල ගහන්න කලින් උසාවිය ළග පොදු ඉඩම් කොටසේ සේවා පියසක් හදන්න කණු ගහලා තිබෙනවා.

කැරගල විශ්ව විද්‍යාල හදන එක ගැන කතා කළා.මම දැනුවත්ව මේ වෙනකොට කර්මාන්තකරුවන් දෙතුන් දෙනෙක් කෑලි වෙන්කරගෙන. අක්කරය දෙක පැක්ට්‍රි ගහන්න දැන් අරගෙන.මේ වනවිට සමහර ඒවායේ සැලසුම්ද අනුමත කරලා. විශ්ව විද්‍යාල කෙසේවෙතත් ටික කාලයකින් වැහිලා යන පැක්ට්‍රි ටිකක් මෙහි හැදෙයි. ඒ පිළිබඳව ඉදිරියේදී කතාකරලා නිවැරදි තීරණයක් ගන්න එක හොඳයි.

මේ අවුරුද්දේ අවසාන රැස්වීම. ජනවාරි මාසයේ රැස්වීම අපි ඉක්මනින් තිබෙනවා. අයවැය සම්මත කර ගැනීමට ඕන නිසා. එදාට සියලුදෙනාම සහභාගි වෙන්න. සමුහ ජායාරූපයක් ගන්න අවශ්‍යයි. ලබන්නාවූ නව වසර සියලුදෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා කියා පතමින් අද දින සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනු ලබනවා.

2022.12.15 දින
දොම්පෙ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය
කිරිඳිවැල.

සභාපති
දොම්පෙ ප්‍රාදේශීය සභාව.